# නියමුවා

“අපට මෙහිදී සඳහන් කිරීමට අවශ්‍ය වන්නේ පෙරමුණු සටන්කරු කාර්යභාරය ඉටු කිරීමට හැක්කේ ඉතාමත් දියුණු න්‍යායයෙන් මඟපෙන්වීම ලබන පක්ෂයකට පමණක්ය යන්න පමණකි.”

ලෙනින්

තෝරා ගත් කෘති,
01වැනි වෙළුම,
137 පිටුව

ISSN 1391 - 1031 | 2022 ඔක්තෝබර් | 27 වෙළුම | 05 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=







# ජනතාවට මිනිස් ජීවිතයක් දිනාදීමට ජාතික ජන බලවේගය සූදානම්

දීර්ඝ කාලයක් පාලකයන් ජනතාවගේ බලය පිටතට පැමිණීමට ඉඩ නොදී දීනභාවයට පත්ගෙන, ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයාටත් බියෙන් ජීවත් වෙන ජනතාවක් නිර්මාණය කර තිබූ නමුත් ජනතාවගේ නැගී සිටීම හමුවේ පළමු වතාවට ජනතාව බලය තිබෙන්නේ තමන් ළඟ බව වටහා ගෙන ඇති බව පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා, විසිරී ඇති බලය සංවිධානාත්මකව ඒකරාශී කර ගනිමින් සමාජීය හා ආර්ථික වශයෙන් පීඩාවට පත් ජනතාවට රසවින්දනය සහිත මිනිස් ජීවිතයක් ලබාදීමට ජාතික ජන බලවේගය සූදානම් බව් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 25වැනි දින ජාතික ජන බලවේගයේ අකුරැස්ස ආසන සභාව පිහිටුවීම වෙනුවෙන් රැස්ව සිටි අතිවිශාල ජනකාය අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

“අරගලය විශාල ආස්වාදයක්. ජනතාවගේ විශාල නැගිටීමක් සිදුවුණා. නමුත් ප්‍රතිඵලය භාග ප්‍රතිඵලයක්. පාර්ලිමේන්තු එන්නවත් ඡන්දය ගන්න බැරි වුණු රනිල් වික්‍රමසිංහ ජනාධිපති වුණා. ඒ නිසා කාටත් පොඩි හෝ අපේක්ෂාභංගත්වයක් තිබෙනවා. උපරිම ජයග්‍රහණය කරා යන්න බැරිවීම ගැන දුකක් තිබෙනවා. හැබැයි දෙවෙනි නැගිටීම සිදුවෙන්නේ ජාතික ජන බලවේගයේ නායකත්වයෙන් සහ මෙහෙයවීමෙන්. අපි සංවිධානය විය යුත්තේ ඒ නිසයි. විසිරිලා උද්ඝෝෂණය කිරීමෙන්, හූ කීමෙන් කළ හැක්කේ තමන්ගේ කෝපය සහ වේදනාව ප්‍රකාශ කිරීම පමණයි; ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

සැබෑ විසඳුම ලබාගත හැකිවෙන්නේ සංවිධානාත්මක බලවේගයක් ගොඩනැගීමෙන් පමණයි. බොහෝ අය කලබල වුණත් අපි කලබල නැහැ. ලංකාවේ තිබෙන ග්‍රාම සේවා වසම් සියල්ලේම අපි කොට්ඨාස සභා හදනවා. සංවිධානාත්මකව, නිසි නායකත්වයකින්, නිසි අරමුණක් සහිතව ඉලක්කයකට ජනතාව නැගී සිටියහොත් සැබෑ ජයග්‍රහණ ලබාගත හැකියි.”

## 03 විකට රූප...

වසර 74ක් පුරා විශේෂයෙන් පසුගිය වසර 45ක් පුරා මේ රට වර්තමානයේ වැටී ඇති අගාධයට ඇද දැමීමට දායක වූ මෙම දේශපාලන විකට රූප පිළිබඳව මරට ජනයා හොඳ අබෝධයක සිටිය යුතුය...



## 05 බහුජාතික සමාගම්...

මේ වන විට මහ බැංකුවත් පාඩුයි. කැබිනට් මණ්ඩලයත් පාඩුයි. පාඩු ලබන ආයතන විකුණා දැමිය යුතු නම් මේ ආයතනත් විකුණා දැමිය යුතුයි. නමුත් මේ විකුණා දමන්න සූදානම් වන්නේ..



## 09 ආසියාතික පසුගාමිත්වය...

රට දැන් වැටී තිබෙන අගාධයෙන් ගොඩගැනීමට නම් ආර්ථික සංවර්ධනයේ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති පමණක් නොව නිදහස් පුරවැසියෙක්ද අවශ්‍ය වේ. සැබෑ ලෙසම ගත්විට වර්තමාන විපතෙන් රට මුදා ගැනීමට නම්..



තරුණ.................................. 04
ජාත්‍යන්තර.......................... 06
ආ.ර්ථිකය ........................... 07
කාන්තා................................ 08
විශේෂාංග............................ 10
වේදිකාව................................ 11

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# බඩු මිල දරාගත නොහැකියි සියලු සේවකයින්ට දීමනාවක් ලබාදෙනු!

## වෘත්තීය සමිති සටන් මඟට



ඉහළ යන ජීවන වියදම හමුවේ පීඩාවට පත්ව සිටින සියලු වැඩකරන ජනතාවට දීමනාවක් ලබාදෙන ලෙස බලකරමින් වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය මගින් රට පුරා වෘත්තීය ක්‍රියාමාර්ග ගණනාවක් දියත් කළේය.  කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී ජනතාව දැනුවත් කරමින් අත්පත්‍රිකා බෙදාහැරීමෙන් හා රට පුරා පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කිරීම මගින් ආරම්භ කෙරුණු මෙම ක්‍රියාමාර්ගය හා සමගාමීව විවිධ නගරවල හා වැඩබිම් මුල්කරගනිමින් උද්ඝෝෂණ ක්‍රියාමාර්ග දියත් විය.

ඒ අනුව වෙළඳ කලාප සේවකයින් හා හෝටල් සේවකයින් දැනුවත් කරමින් අත්පත්‍රිකා බෙදාහැරීමද සිදු විය. එසේම රෝහල් ක්ෂේත්‍රයේ සියලු රෝහල් සේවකයින්ට වහාම ජීවන වියදමට සරිලන ලෙස දීමනාවක් ලබාදෙන ලෙස බලකරමින් උද්ඝෝෂණ ක්‍රියාමාර්ග ආරම්භ කෙරුණු අතර කොළඹ ජාතික රෝහල, දකුණු කොළඹ කළුබෝවිල රෝහල ඇතුලු රෝහල් ගණනාවක මෙම විරෝධතා ක්‍රියාමාර්ග දියත් කරනු ලැබිණි.

# මර්දනයට හා විකිණීමට එරෙහිව කොළඹදී සම්මන්ත්‍රණයක්



'ජනතාවට සහන නොදෙන ආණ්ඩුවේ මර්දනය හා විකිණීම පරදවමු' මැයෙන් පසුගියදා කොළඹ නගර ශාලාවේදී සම්මන්ත්‍රණයක් පැවැත්විණි. වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය මගින් සංවිධානය කර තිබූ මෙම සම්මන්ත්‍රණය සඳහා එහි සම කැඳවුම්කරුවන්වන් වන වසන්ත සමරසිංහ, උදේනි දිසානායක, මහින්ද ජයසිංහ, චන්දන සූරියආරච්චි, රවි කුමුදේශ්, නිශාන්ත රණවීර, අශෝක රංවල ඇතුළු වෘත්තීය සමිති නායකයෝ සහ නියෝජිතයෝ සහභාගි වූහ. මෙහිදී සියලු වෘත්තීය සමිති නායකයින් හා නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ඒකාබද්ධ ප්‍රකාශයකට අත්සන් තැබීමද සිදුවිය.

# වරාය විකුණා ඩොලර් හොයමුද? වරාය ගොඩනගා ඩොලර් හොයමුද?



'වරාය විකුණා ඩොලර් හොයමුද? වරාය ගොඩනගා ඩොලර් හොයමුද?' තේමාව යටතේ සම්මන්ත්‍රණයක් පසුගියදා කොළඹ කොටුව සේවාමුක්ත හට සංගම් ශාලාවේදී පැවැත්විණි. මේ සම්මන්ත්‍රණය වරාය වෘත්තීය සමිති ඒකාබද්ධ සන්ධානය මගින් සංවිධානය කෙරුණු අතර වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරයේ වෘත්තීය සමිති නායකයෝ ඊට එක්වී සිටියහ.

මෙහිදී සම්මන්ත්‍රණය අමතමින් සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකානගේ සහෝදරයා සඳහන් කළේ, සංචාරක ව්‍යාපාරය ගොඩනැංවීම සඳහා වරාය පාවිච්චි කළ යුතු වුවත් මේ දක්වා ආණ්ඩු එයට අතගසා නැති බවත් දැනට පවතින ඩොලර් අර්බුදයට විසඳුම් ගණනාවක් වරාය සංවර්ධනය කිරීම මගින් රටට අත්පත් කර ගත හැකි බවත්ය.

# වෘත්තීය සමිති ව්‍යාපාරයෙන් පුරවැසි ආඥාවක්

## වසන්ත සහෝදරයා දකුණු ආසියානු ILO සමුළුවට




ලෝක කම්කරු සංවිධානයේ (ILO) ආසියානු කලාපීය සමුළුව ඉන්දියාවේ නවදිල්ලි නගරයේදී පසුගිය සැප්. 19-21 දිනවලදී පවත්වන ලද අතර ඒ සඳහා අන්තර් සමාගම් සේවක සංගමය නියෝජනය කරමින් එහි සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා සහභාගි විය. වෙනස්වන වැඩ ලෝකයේ වෘත්තීය සමිති බලය ගොඩනැගීම, වැඩකරන ජනතාව රැක ගැනීම හා සමාජ සාධාරණත්වය පෙරට ගෙනඒම යන තේමාව මුල්කරගනිමින් මෙම කලාපීය සමුළුව පැවැත්විණි. මෙහිදී වසන්ත සමරසිංහ සහෝදරයා ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය නියෝජිතයින් මුණගැසීම සිදුවුණු අතර එහිදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාක්ස්වාදී) ප්‍රධාන ලේකම් සීතා රාම් යෙචූරි සහ එම පක්ෂයේ මධ්‍යම කාරක සභික අරුන් යන සහෝදරවරුන් මුණගැසී පොදු වැදගත්කමක් ඇති කරුණු පිළිබඳ සාකච්ඡා කර ඇත.

# ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුව - 2022.09.22



## අධ්‍යාපනය අර්බුදයට ගොස් තිබුණත් ආණ්ඩුවේ කිසිදු අවධානයක් නැහැ

**ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය**

මෑත කාලයේ පේරාදෙණිය ශිෂ්‍යයන් තිදෙනෙක් සියදිවි නසා ගත්තා. තරුණ ජීවිත නැතිවීම මේ සමාජයේ හිතන මතන අයට දැඩි කම්පනයක් ඇති කරනවා. සියදිවි නසා ගැනීම පමණක් නොවේ තරුණ ජීවිත කවරාකාරයෙන් අහිමි වුණත් දරා ගන්න අමාරුයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු රාශියක් මතුවී දෙමාපියන්ටත්, ශිෂ්‍යයන්ටත්, ගුරුවරුන්ටත් දැඩි මානසික පීඩනයක් ඇතිවන තත්වයක් අදත් තිබෙනවා. කාලයක් තිස්සේ අධ්‍යාපනය පිළිබඳ වගකීම ශිෂ්‍යයන් සහ ඔවුන්ගේ පවුල් මත පටවා තිබුණා. ඊට අමතරව අවුරුදු දෙකහමාරක පමණ කාලයක් නිසි අධ්‍යාපනයක් සිදුවුණේ නැහැ. අධ්‍යාපනය කියන්නේ තොරතුරු හුවමාරුව සහ විභාග ක්‍රමයක් පමණක් නොවේ; සමාජානුයෝජන ක්‍රියාවලිය, ජීවිතයට මුහුණ දීම, දැනුම, පෞරුෂත්ව වර්ධනය යන සියල්ලම ලැබිය යුතු දෙයක්. විභාග පැවැත්වීම පමණක් ඉලක්ක කරගෙන ක්‍රියා නොකළ යුතුයි.

දරුවන්ගේ පාසල් පැමිණීම නිරාහාරව සිදුවන බවට විශාල වශයෙන් වාර්තා වෙනවා. දරුවන් ක්ලාන්තවී වැටෙනවා. මෙවැනි තත්වයක් තුළ දරුවන් ඉගෙන ගන්නේ කොහොමද කියලා ආණ්ඩුව කිසිම තැකීමක් කරන්නේ නැහැ. පවුල්වල ආර්ථික පීඩනය ඉහළ යාමත් සමග දරුවන්ගේ අධ්‍යාපනයට, ගුරුවරුන්ට, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයට යන සියලු ක්ෂේත්‍රවලට බලපානවා. මානසික සෞඛ්‍යය පිළිබඳව විශ්වසනීය දත්ත නැහැ. විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තීරණ ගැනීමට දත්ත අත්‍යවශ්‍යයි. තරුණ ජීවිතවල මානසික සුවය සහ මනෝ සමාජීය යහපැවැත්ම වෙනුවෙන් මැදිහත්වීමේ විශාල වගකීමක් අධ්‍යාපන ක්ෂේත්‍රයට තිබෙනවා. මේ යථාර්ථය තේරුම් ගෙන ප්‍රශ්නය විසඳීමට ආණ්ඩුව ප්‍රමුඛතාවය දිය යුතුයි. ඒ වගේම මේ ක්ෂේත්‍රයේ වෘත්තීය සංවිධානවලට මේ සම්බන්ධයෙන් මැදිහත්වීමේ විශේෂ වගකීමක් තිබෙනවා. අධ්‍යාපනයේ වගකීම පංති පැවැත්වීම පමණක් නොවේ. පවතින ප්‍රශ්නවලට විසඳුම් සෙවීම, පාසල් සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය අර්බුදය ගැනත් ප්‍රමුඛතම මැදිහත්වීමක් අවශ්‍යයි.

## අලුතින් හිතන මිනිසුන් ගොඩනඟන අධ්‍යාපන ක්‍රමයක් අපට අවශ්‍යයි

**ජාතික ජන බලවේගයේ කොළඹ දිස්ත්‍රික් විධායක සභික ආචාර්ය සිතුමිණ රත්නමලල**

අධ්‍යාපනය සම්බන්ධයෙන් සම්ප්‍රදායක් විදිහට සාකච්ඡා කර තිබුණේ හුණුවටය කතාවේ වැල් පාලමෙන් එගොඩ වන ගෘෂා කියූ "අපට පුතේ මඟක් නැතේ, මේ මඟ මිස යමන් පුතේ" යන තත්වයයි. අපේ අධ්‍යාපනය සම්බන්ධයෙන් උතුරේ සිට දකුණටම දැක්කේ මේ විදිහට. පවුලක් විදිහට, සමාජයක් විදිහට සහ රටක් විදිහට ගොඩයන්න තිබෙන එකම මාර්ගය අධ්‍යාපනය හැටියටයි දැක්කේ. අපිට හයියක් දුන්න, අපි විශ්වාස කළ අධ්‍යාපනය කෙටි කාලීනව සහ දීර්ඝ කාලීනව විසඳුම් සෙවිය යුතු අතිශයින් අර්බුදකාරී තත්වයකට පත්කර තිබෙනවා. අවංකවම කියනවා නම්, අපේ ගැලවීමකට වඩා ශාපයක් බවට දැන් පත්කර තිබෙනවා. පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වාම අධ්‍යාපනය බරක් කරලා. දරා ගන්න බැරි මට්ටමක අතිවිශාල මානසික පීඩනයක් ඇති කර, අපේ විවේකය සහ අපේ ජීවිතය අපෙන් උදුරා ගන්නා සංවේදීතාවය අතිශයින් පහත හෙළන ක්‍රියාදාමයක් බවට පත්කර තිබෙනවා.

මේ සමාජ ආර්ථික ක්‍රමය තුළ අනිකාට සවියක් වෙන්න, මිත්‍රකම් පවත්වාගෙන යන්න, සංවේදී වෙන්න, සහ කම්පනය දැනෙන්න, අවශ්‍ය ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදී නැහැ. ප්‍රශ්නයකට පිළිතුරු සොයන නිර්මාණාත්මක ක්‍රම අධ්‍යාපනය තුළ උගන්වන්නේ නැත්නම්, යුතුකම් සහ අයිතිවාසිකම් ගැන උගන්වන්නේ නැත්නම් මනුෂ්‍යයෙක් ගොඩනැගෙන්නේ කෙසේද? තමන්ටත් අනුන්ටත් සවියක් වෙමින් ජීවත් වෙන්න උගන්වන්නේ කොහොමද? මේ අධ්‍යාපනය ක්‍රමය ඇතුලේ මනුෂ්‍යයෙකුට ලබාදිය යුතු අවම සමාජීය සහ මනෝ විද්‍යාත්මක පුද්ගලානුබද්ධ කරුණු සම්පූර්ණයෙන්ම නොසලකා හැරලා. පවතින්නේ ඉතාමත් දෘඪ, මානුෂිකත්වයෙන් තොර, අධ්‍යාපනයක්. ප්‍රශ්නයකට උත්තර සොයන්න අතිශයින් සම්ප්‍රදායික රාමුවක් තුළ සිතීමෙන් රටක් ගොඩනඟන්න බැහැ. අලුත් අලුත් දෑ තනන්න අලුත් අලුත් විදිහට හිතන්න හැකි වෙන්න ඕනෑ. අලුතින් හිතන මිනිසුන්ව ගොඩනඟන අධ්‍යාපන ක්‍රමයක් අපට ඕනෙ වෙනවා. කෙටි කාලීනවත්, දීර්ඝ කාලීනවත් මනුෂ්‍යයින් විදිහට සංවේදී, තවත් මිනිසුන්ව දරාගත හැකි සමාජයක් ගොඩනැගීමට සුදුසු අධ්‍යාපනයක් නැතිතාක් කල් අපි නිදහස් මිනිසුන් වෙන්නේ නැහැ. නිදහස් නොවෙන මිනිසුන්ගෙන් මේ රට ඉස්සරහට යන්නේ නැහැ."

## දරුවන් රැකබලා ගැනීමට වේගවත් මැදිහත් වීමක් අවශ්‍යයි

ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික, ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික **වෛද්‍ය නලින්ද ජයතිස්ස**

"අධ්‍යාපනය කියන්නේම මනස සම්බන්ධ ක්‍රියාකාරීත්වයක්. හොඳ අධ්‍යාපනයක් ලබාගන්න මානසික නිරෝගීභාවයත්, මානසික සමබරතාවයත් තියෙන්න ඕනෑ. විශේෂයෙන් පාසල් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලැබිය හැකි මානසික මට්ටමක් තිබෙනවා දැයි බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. පාසල් දරුවන් ආහාර ලබාගන්නා ආකාරය ගැන මාධ්‍ය වාර්තා ගණනාවක සඳහන් වී තිබෙනවා. මේ වාර්තාවලින් ආණ්ඩුව දරුවන්ගේ මන්දපෝෂණ තත්වය වර්ධනය වෙමින් තිබෙන බව පිළිගත යුතුයි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ 90%ක් නතර වී, රාජ්‍ය සේවක වැටුප් ගෙවන්න සල්ලි නැති බව බන්දුල ගුණවර්ධන ප්‍රකාශ කර තිබෙන පසුබිමක, දඹුල්ලේ ලොකු ළූණු ගොවීන්ට හතේ හත වැදී ඇති බවට ප්‍රවෘත්ති පළ වෙද්දී, මේ මන්දපෝෂණ තත්වය සිදුවිය නොහැකි තත්වයක් නොවේ.

රැකියා අහිමිවීම හෝ රැකියා කළ කාලය සීමාවී සිටින මාපියන්ට තම දරුවන් පෝෂණය කිරීමේ හැකියාව අඩුවී ඇති බව පිළිගත යුතුයි. දරුවෙකුට මාස ගණනාවකින් බිත්තර, මාළු, මස් ලබානොදුන් බව දෙමාපියන් කියනවා. අපේ රටේ ජනගහනයෙන් ලක්ෂ 60කට වැඩි ප්‍රමාණයක් එක වේලක් ආහාර ගන්නා බව ඇතැම් වාර්තාවලින් හෙළිකර තිබෙනවා. මේ වාර්තා සහ අදාළ සිදුවීම් ප්‍රතික්ෂේප කරමින්, වාර්තා ලබාදෙන නිලධාරීන්ට තර්ජනය කරමින් යන උද්ධච්ඡ ගමනක ආණ්ඩුව නිරතවී සිටිනවා. ආණ්ඩුවට මේවා ප්‍රශ්න නොවෙන්න පුළුවන්. නමුත් සාතිශය බහුතරයක් ජනතාවට මේ ප්‍රශ්න අදාළයි. දැන් දරුවන් මතින් ප්‍රශ්න ගලාගෙන යන්න පටන්ගෙන තිබෙනවා. දරුණු මන්දපෝෂණයේ ප්‍රතිඵල පාසල් රැස්වීමේදී දරුවන් ක්ලාන්තයෙන් ඇදවැටීමෙන් පමණක් සීමා නොවී මානසික වර්ධනයට සිදුකරන බලපෑම විසින් ඉදිරි පරම්පරාවල දරුවන්ට බලපානවා. මේ නිසා ආණ්ඩුවක් හැටියට මේ කෙරෙහි අවධානයක් යොමු කරන්න ඕනෑ. අවුරුදු 5ට වඩා අඩු දරුවන් සිටින දෙමාපියන්ගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ දරුවා සම්බන්ධ පෝෂණ ඌනතාවයන් ගැන නිසි පරීක්ෂණයක් කර ගැනීම අත්‍යවශ්‍ය බවයි.

මේ පාලකයෝ ඔබේ දරුවන්ට ආදරේ නැහැ. ඔබ ඔබේ දරුවන්ට ආදරෙයි. අපි ඔබේ දරුවන්ට ආදරෙයි. මේ රට ඔබේ දරුවන්ට ආදරෙයි. ඔබට, අපට, මේ රටට ඔබේ දරුවන් ඕනෑ. ඒ නිසා ඔබේ දරුවන් වෙනුවෙන් ඔබ කඩිනමින් පියවර ගන්න. සෞඛ්‍යමය වශයෙන් වගේම දේශපාලනිකවත් ඔබේ දරුවන් රැකබලා ගන්න. ඒ වෙනුවෙන් අපි සැමදෙනාම ඉතාම වේගවත් මැදිහත්වීමක් කළ යුතුයි."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අර්බුදයේ සැඟවුණු අනතුර

ලංකාව දැන් වසරකට වඩා වැඩි කලක් තිස්සේ දැවැන්ත ආර්ථික කඩා වැටීමකට, ආර්ථික අවපාතයකට මුහුණදී තවමත් විසඳාගත නොහැකිව සිටී. ගෝඨාභය රාජපක්ෂ පලවාහැරීමෙන් ඇතිවූ පුරප්පාඩුවට රාජපක්ෂලා විසින්ම පත්කරගත් රනිල්-රාජපක්ෂ පාලනය තුළද අර්බුදය වර්ධනය වෙමින් යනවා මිස විසඳීමේ මඟක ගමන් නොගනී.

අර්බුදය ජනතාවට මතුපිටින් ප්‍රකාශ වූයේ තෙල් හිඟය, තෙල් මිල ඉහළයාම, සියලු භාණ්ඩවල මිල විශාල වශයෙන් ඉහළ යාම, ආදායම් බිඳවැටීම, භාණ්ඩ සීමාවීම ආදිය තුළිනි. ඒ සියල්ලට හේතු වූයේ ලංකාව මුහුණදී ඇති මූල්‍ය අර්බුදය නිසාය. ලංකාව රටක් ලෙස රටට අවශ්‍ය ඩොලර් හා රුපියල් උපයන්නේ නැත; හිඟයක් තිබේ. වසර 40ක විවෘත ආර්ථිකය විසින් හා එම ආර්ථිකය තුළ අනුගමනය කළ පාලකයන්ගේ වංචා දූෂණ නාස්තිය හා අකාර්යක්ෂමතාවය විසින් රටට මෙම අර්බුදයට ඇද දමනු ලැබ තිබේ.

ලංකාවේ ආහාර උද්ධමනය 91%ක් බව පැවසේ. එය ඉක්මනින් 100% පසුකරනු ඇත. ජනතාවගේ හා ළමුන්ගේ පෝෂණය සඳහා අත්‍යාවශ්‍ය ආහාර ගිනි ගණන්ය. බිත්තරයක මිල රු.60ට ළඟා විය. මාලු හා මස් ආහාරයට එක්කරගත නොහැකි තරම් මිල අධිකය. එළවළුද පලතුරුද එසේමය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ අනාගතය බාරගන්නා දරු පරපුර මන්දපෝෂණයට ගොදුරු වීමය.

ඔක්තෝබර් 01වැනිදා අප ලෝක ළමා දිනය සමරද්දී ලංකාවේ ළමයි මන්දපෝෂණයට ගොදුරුවී සිටිති. එය මේ වන විට 50% ඉක්මවා ඇත. නිවැරැදි සංගණනයක් කරන්නේ නම් එය මීටත් වඩා වැඩිවනු ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රදේශයේ කළ සමීක්ෂණයක ප්‍රතිඵල වී ඇත්තේ දරුවන්ගේ මන්දපෝෂණ තත්වය 80%ක් බවය. මෙය ඉතා බරපතළ ප්‍රශ්නයකි.

දරුවන් මන්දපෝෂණයට ගොදුරුවීම පිළිබඳ අර්බුදයේ ප්‍රකාශ වීම් දැනටමත් අපට පෙනෙන්නට පටන්ගෙන තිබේ. ඊට එක් උදාහරණයක් වන්නේ දරුවන් පාසලේදී උදේ රැස්වීමේදී ක්ලාන්තය හැදී ඇදවැටීමය. එම දරුවන් බොහෝ විට පෙරදා රාත්‍රී මෙන්ම එදින උදෑසන ආහාර ගෙන නැති බව සොයාගෙන තිබේ. එසේම ගම්බද දරුවන් පාසල් පැමිණීමද අඩුවී තිබේ. ඒ කුසගින්නේ පාසල් පැමිණීමට නොහැකිකම හා බස් ගාස්තුව පවා සොයා ගැනීමට නොහැකිවීම නිසාය.

මෙය ඉතා බරපතළ තත්වයකි. මැතිවරණ කාලයේ රාජපක්ෂලා දරුවන් උඩ දමමින් රූපවාහිනී කැමරා ඉදිරියේ 'දරු සුරතල්' පෙන්නුවද සත්‍ය ලෙසම අනාගත පරපුරක් මන්දපෝෂණයෙන් රෝගී වූ පරපුරක් බවට පත්කර තිබේ. තව වසර 10-15ක් රටේ අනාගතය බාරගනු ලබන්නේ වර්තමාන දරු පරපුර විසිනි. එම දරු පරපුර උග්‍ර මන්දපෝෂණයට ගොදුරුවී තිබෙන විට රටේ අනාගතය ගොඩනගන්නේ කෙසේද?

දරුවන්ගේ ආහාර ප්‍රශ්නය කොතරම් බරපතළද යත් දැන් බොහෝ පාසල්වල ගුරුවරු අමතර කෑම එකක් රැගෙනවිත් කෑම නැති දරුවන්ට ගැනීමට හැකිවන පරිදි තබන 'බත් බැංකු' බිහිකර තිබේ. එය ඉතාම මානුෂීය අගය කළ යුතු ක්‍රියාවකි. එහෙත් ඉන් මෙම අර්බුදය විසඳිය නොහැක. මෙය විසඳිය යුත්තේ පාලකයින් විසිනි. ගුරුවරුන්ට ඇති මානුෂිකත්වය පාලකයින්ට නැත. ඔවුන් දිගටම මුදල් නාස්ති කරති; කොමිස් ගසති; ජනතාව මත බර පටවති. අපේ දරුවන් මන්දපෝෂණයට ගොදුරු වන්නේ ආණ්ඩුවේ මැති ඇමැත්තෝ අධිපෝෂණයෙන් යුතුව සිටියදීය. ඛේදවාචකය වී ඇත්තේ එයයි.

ආහාර නොමැතිකමේ අර්බුදයට අමතරව සමහර ආහාරවල ශරීරයට අහිතකර දේ එකතුවීමද මාරාන්තික අර්බුදයක් වී තිබේ. මෑතකදී වාර්තාවූ පරිදි දිළිඳු පවුල්වල දරුවන්ට ලබාදෙන ත්‍රිපෝෂවල අෆ්ලටොක්සින් නම් විෂකාරකය සිරුරට අහිතකර ප්‍රමාණයෙන් අඩංගු වී තිබේ. ආහාර නැතිකමින් මන්දපෝෂණයට ගොදුරු කරන දරුවන්ට ආණ්ඩුව 'වස කැවීමට'ද පටන්ගෙන තිබේ නම් එය දරාගන්නේ කෙසේද?

රට තුළ දැරුවන් මුහුණ පා ඇති කුසගින්න, මන්දපෝෂණය, ආහාරවලට වසකාරක එකතුවීම ආදිය නිසා සිදුවන විනාශය වසර ගණනාවකට නිවැරදි කර ගත නොහැකි විනාශකාරී එකක් බව ඉතා පැහැදිලිය. මේ පිළිබඳව මෙරට දුෂ්ට පාලකයින්ට කිසිදු හැඟීමක් නැත; වගවීමක් නැත. එසේම අපේ සමාජයේ බොහෝ දෙනෙක්ද විශේෂයෙන් දෙමාපියන් මෙම අනතුර වටහාගෙන ඇති බවක් පෙනෙන්නට නැත.

වසර 74ක් පුරා රට පාලනය කළ පාලකයන් රටේ ආර්ථිකය විනාශ කර, රට ණය බරක ගිල්ලවා, රටේ සම්පත් විදේශවලට විකුණාදමා අවසානයේ රටේ අනාගත පරපුරද මන්දපෝෂණයෙන් යුත් දුර්වල රෝගී පරපුරක් බවට පත්කරනු ලැබ තිබේ.

ඉදින් අප අපෙන්ම ඇසිය යුතු ප්‍රශ්නයක් තිබේ. එනම් මේ දුක් වින්දා මදිද යන්නය; මේ විනාශය දරා සිටියා මදිද යන්නය. එබැවින් දැන් වහාම මෙම විනාශය තුරන් කිරීමටත් අපේ දරු පරපුර මේ විනාශයෙන් මුදා ගැනීමටත් වැඩිහිටියන් අධිෂ්ඨාන කර ගත යුතුව තිබේ.

රටත් ජනතාවත් දරු පරපුරත් මේ විනාශයෙන් මුදා ගත හැක්කේ පවතින පාලනය හැකි ඉක්මනින් පලවා හැර නව පාලනයක් ජනතාවගේ ගැටලුවලට විසඳුම් දිය හැකි පාලනයක් දරුවන්ගේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කළ හැකි පාලනයක් නිර්මාණය කිරීමෙනි. මේ ඒ වෙනුවෙන් ක්‍රියාකාරී විය යුතු මොහොතය.

# දේශපාලනයේ විකට රූප හා ජනතාවගේ වගකීම

පසුගිය මාස කිහිපය තරම් ලංකාවේ ජනතාවට දේශපාලනයේ සැබෑ තත්වය වටහා ගැනීමට උදාහරණ සැපයූ, අත්දැකීම් ලබාදුන් කාලයක් නැති තරම්ය. දේශපාලනයේ විකට රූප මොනවාද, බොල් පිළිම මොනවාද යන්නත් ජනතාව විශ්වාස කළ යුත්තේ කුමන දේශපාලන මාවතක්ද යන්නත් තේරුම් ගැනීමට පසුගිය කාලයේ සිදුවූ සිදුවීම් හොඳටම ප්‍රමාණවත්ය.



නූතන දියසෙන් කුමාරයා ලෙස අර්ථකථනය කර, වෙස්ගන්වා, දේශපාලනයේ 'වැඩකාරයෙක්' ලෙස ප්‍රතිරූප මවා, ලී ක්වාන් යූ ලෙස හඳුන්වා බලයට ගෙනා ගෝඨාභය රාජපක්ෂ දුර්වල, දැක්මක් නැති, අසාර්ථක හිස් මිනිසෙක් බව වසර දෙකක් යද්දීම තේරුම් ගැනීමට ජනතාවට හැකි විය. එහෙත් ජනතාව එම අත්දැකීම ලබාගත්තේ තවමත් නිවැරැදි කර ගැනීමට නොහැකි, ආපසු කැඳවීමට නොහැකි තරමේ බලයක් ඔවුනට ලබා දී තිබියෙදීය.

එබැවින් මින්පසු යළි යළිත් මෙවැනි බොල් පිලිමවලට, විකට රූපවලට රැවටීමට රටක ජනතාවකට පුළුවන්කමක් නැත. ගෝඨාභය රාජපක්ෂ පලවා හැරීමත්, ඔහුගේ ඉල්ලා අස්වීමත් සමග හිස් වූ ජනාධිපති ධුරයට, රාජපක්ෂලා විසින්ම තම ප්‍රතිවාදියා ලෙස, රට විනාශ කරන, රට පාවාදෙන නූතන දොන් ජුවන් ධර්මපාල ලෙස හැඳින්වූ රනිල් වික්‍රමසිංහ පත්කරනු ලැබීම දේශපාලනයේ විශාල පාඩමකි. රනිල්ලා, රාජපක්ෂලා බලය සඳහාම වෙන්ව රඟපෑ, එහෙත් බලය සඳහාම එකතු විය හැකි එකම පංතියක එකම පැලැන්තියක අය බව වටහා ගැනීමට දැන් ඉතා පහසු වී තිබේ. ඒ නිසාම බිම් මට්ටමේ, ගම් මට්ටමේ ජනයා තවදුරටත් එවැනි පක්ෂවලට බෙදී සිටීම තේරුමක් නැත. දැන් ඔවුන් ඉදිරියේ ඇත්තේ නව දේශපාලන මාවත් වෙත යොමු විමය. මේ මොහොතේ දේශපාලනයේ ලබාගත හැකි විශාලතම ජයග්‍රහණය එයය.

පසුගිය කාලයේ ඊනියා දේශප්‍රේමීන් ලෙස රඟමින් 'මව්බිම' ගැන 'ජාතියේ ආරක්ෂාව' ගැන ජනතාව බියවද්දමින් රාජපක්ෂවරුන් සිංහාසනාරූඪ කිරීමට රටක් මුලා කළ වීරවංශ, ගම්මන්පිල ඇතුළු කල්ලියේ වර්තමාන හැසිරීම විසින්ද ජනතාවට උගන්වා ඇත්තේ එවැනි දේශපාලන විකට රූපවලට නැවත ඉඩක් නොදිය යුතු බව නොවේද? මේ වන විට වීරවංශ - ගම්මන්පිල - වාසු කණ්ඩායම දේශපාලන බිමේ අවතැන්ව සිටිති. ඔවුහු දේශපාලන නන්නත්තාරයින් බවට පත්ව සිටිති. රාජපක්ෂවරුන් පිළිබඳ මුසාවාද පවසා ජනතාව රැවටීම පිළිබඳ ලොකුම වගකීම පැවරෙන්නේ ඔවුන්ටය. එහෙත් ඔවුන් 'ඊනියා' ස්වාධීන වෙසක් ගෙන කාගේ හෝ ඇගේ එල්ලීමට බලාගෙන සිටිති. රාත්‍රී කාලයේ ගනුදෙනුකරුවෙක් හමුවන තුරු පහන් කණුවක් යට සිටින අභිසරු ලියකගේ හා ඔවුන්ගේ වෙනසක් නැත.

එසේම විටක බොරු ආණ්ඩු විරෝධයක් පෙන්වන, තවත් විටක ආණ්ඩුව සමග කටයුතු කරන, යළි ස්වාධීන බලයක් ලෙස රංගනයේ යෙදෙන මෛත්‍රීපාලගේ ශ්‍රීලනිපයද දැන් සිටින්නේ දේශපාලන බිමේ අනාථයන් බවට පත් වෙමිනි. මෛත්‍රීපාල පක්ෂයේ නායකයා ලෙස පසුගියදා විශාල බලතල ප්‍රමාණයක් තමන්ට අත්පත් කරගෙන පක්ෂය පාලනය කිරීමට උත්සාහ කළද මස් කටුවක් දුටු විට දම්වැල් කඩාගෙන දුවන සේ ශ්‍රීලනිපයේ නිමල් සිරිපාල, මහින්ද අමරවීර ඇතුළු කිහිපදෙනෙක්ම රනිල්ගේ ආණ්ඩුවේ ඇමති ධුර බාරගත්තේ පක්ෂ තීරණයද නොසලකමිනි. මොවුනට කිසිදු ප්‍රතිපත්තියක් නැති බවත් එකම ප්‍රතිපත්තිය ඇමති ධුර, වරප්‍රසාද හා තනතුරු ලබා ගැනීම බවත් වටහා ගැනීමට තවත් උදාහරණ අවශ්‍ය වන්නේ නැත.

පාර්ලිමේන්තුවේ නිල විපක්ෂය නියෝජනය කරන සමගි ජන බලවේගයද මුහුණ පා ඇත්තේ මෙකී ඉරණමටමය. තම නායකයන් රනිල්ගේ ආණ්ඩුවේ ඇමති ධුර ගැනීමෙන් වළක්වා ගැනීමට විශාල ප්‍රයත්නයක යෙදීමට සජිත් ප්‍රේමදාසට සිදුව තිබේ. ඒ නිසා ආණ්ඩුවේ 'හොඳ වැඩවලට' උදව් කරන බව නිතර පැවසීමට සජිත්ට සිදුව තිබේ. පසුගියදා ලංකාවට පැමිණි USAID ආයතනයේ සමන්තා පවර් ඉදිරියේ මෙම අදහස ප්‍රකාශ කළ විට ඇය සජිත්ගෙන් අසා තිබුණේ ආණ්ඩුවේ එවැනි 'හොඳ වැඩ' මොනවාදැයි එකක්වත් පෙන්වන ලෙසය. කෙසේ වෙතත් දැන් ස.ජ.බ.යද රනිල්ගේ ජාතික සභාවට ඇතුල් වී තිබේ. දැන් සජිත් ප්‍රේමදාස ආණ්ඩුවට යාම නොයාම සම්බන්ධයෙන් සිටින්නේ "මඟ සිටියොත් තෝ නසී ගෙදර ගියොත් අඹු නසී" යන උභතෝකෝටිකය තුළය.

මේ අතර පසුගිය කාලයේ රාජපක්ෂවරුන් බලයට ගෙනඒමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රට තුළ ජාතිවාදය ඇවිළ වූ, මුස්ලිම් විරෝධයක් නිර්මාණය කළ ජාතිවාදී කල්ලිද දැන් ඔලුව සඟවාගෙන සිටිති. වඳ ඇඳුම්, වඳ කොත්තු, වඳ සාපි පිළිබඳ ප්‍රවෘත්ති මැවූ සමහරු දැන් සිටින්නේ එවැන්නක් සිදු නොවූ ලෙසය. මෙවැනි ප්‍රවෘත්ති මැවූ ඊනියා ජාතික මාධ්‍ය ආයතන ඒ පිළිබඳ කනගාටුව හෝ ප්‍රකාශ කර නැත. මෙහි අලුත්ම හාස්‍යජනක උදාහරණය වන්නේ රට තුළ මුස්ලිම් විරෝධය ඇවිළවීමේ පෙරමුණේ සිටි බොදුබල සේනා සංවිධානයේ ඥාණසාර හිමි සෞදි අරාබියානු ජාතික දින උත්සවයට සහභාගිවී සෞදි තානාපති නිලධාරීන් සමග එකට වාඩිවී අතට අත දෙමින් සුහදව සිටින ඡායාරූප හා ප්‍රවෘත්ති පළ වී තිබීමය.

දේශපාලනයේ කොන්ත්‍රාත්කරුවන් ලෙස කටයුතු කළ ඉහත සියලුම පක්ෂ හා සංවිධානත් එහි නායකයිනුත් තමන්ගේ දේශපාලන කොන්ත්‍රාත්තුව ඉවර වූ පසු ලැබුණ දෙයක්ද රැගෙන වෙනත් භූමිකාවකට මාරුවන අතර ඉන් විනාශයට පත්ව ඇත්තේ රටය; දුකට පත්ව ඇත්තේ ජනතාවය. මොවුන් යළිත් අවස්ථාව ලද විට තම විකට රූප වෙනස් කරමින් ජනතාව රැවටීමේ කොන්ත්‍රාත්තුවට පණ පොවනු ඇත. ජනතාව ඔවුන්ගෙන් පරෙස්සම් විය යුතු අතර ඔවුන් කවුරුන්දැයි නිවැරදිව හඳුනා ගැනීමට දැන් ජනතාවට පහසු වී තිබේ.

වසර 74ක් පුරා විශේෂයෙන් පසුගිය වසර 45ක් පුරා මේ රට වර්තමානයේ වැටී ඇති අගාධයට ඇද දැමීමට දායක වූ මෙම දේශපාලන විකට රූප පිළිබඳව මෙරට ජනයා හොඳ අබෝධයක සිටිය යුතුය. ඒ, යළිත් ඔවුනට නොරැවටී සිටීමටය. දැන් එය පහසු වී තිබේ. මන්ද වර්තමාන අර්බුදය විසින් ඔවුන් නිරුවත් කරනු ලැබ, හෙළිදරව් කරනු ලැබ තිබෙන බැවිනි. මේ වන විට මෙවැනි බොහෝදෙනා දේශපාලනයේ අතරමංවී සිටිති. ඒ අතරම ඔවුන් යළිත් ජනයා රවටා ගැනීමේ අලුත් මාර්ගද සොයති. රෑ වැටුන වළේ දවල් නොවැටී සිටීමට ජනතාව පරෙස්සම් විය යුත්තේ මේ නිසාය.

> වසර 74ක් පුරා විශේෂයෙන් පසුගිය වසර 45ක් පුරා මේ රට වර්තමානයේ වැටී ඇති අගාධයට ඇද දැමීමට දායක වූ මෙම දේශපාලන විකට රූප පිළිබඳව මෙරට ජනයා හොඳ අබෝධයක සිටිය යුතුය. ඒ, යළිත් ඔවුනට නොරැවටී සිටීමටය. දැන් එය පහසු වී තිබේ. මන්ද වර්තමාන අර්බුදය විසින් ඔවුන් නිරුවත් කරනු ලැබ, හෙළිදරව් කරනු ලැබ තිබෙන බැවිනි.

දැන් අපේ රට වැටී තිබෙන මේ ආර්ථික සමාජ දේශපාලන අගාධයෙන් ගොඩගැනීමට නම් ප්‍රතිපත්ති මත පදනම් වුණු විශ්වාස කළ හැකි නව දේශපාලන බලවේගයක් සමග නව දේශපාලන ගමනක් යාමට ජනතාවට සිදුවේ. මේ මොහොතේ රටේ ජනතාවගේ විශ්වාසය දිනෙන් දිනම වැඩි කර ගනිමින් ඉලක්ක සහගතව, අරමුණු සහිතව හා වගකීමක් සහිතව දේශපාලනයේ යෙදෙන බලවේගය බවට පත්ව ඇත්තේ ජාතික ජන බලවේගයයි. එබැවින් එය විශ්වාස කිරීමත්, එය වටා එකතුවීමත් එය හා එක්ව වර්තමාන අභියෝග ජය ගැනීමට අධිෂ්ඨානයෙන් පෙරට ඒමත් හැර අපේ රටේ ජනතාවට ඉදිරියේ වෙනත් විකල්පයක් නැත.




# අරගලයට ආරම්භයක් අවැසිමය...!

අපේ රටේ සෑම පවුල් 4/10 ක්ම ආහාර හිඟකමින් පෙළෙන බව ජාත්‍යන්තර සංවිධාන වාර්තා කළේය. මේ නිසාම අපේ රටේ අවුරුදු 05ට අඩු බර සහිත දරුවන් වාර්තා වීම 14.6%කින් ඉහළ ගොස් ඇත. මෙහි වැඩිම වාර්තාවීම නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වන අතර එය 21.9%කි. පිළිවෙළින් වව්නියාව (19.9%) හා අම්පාර (18.5%) දෙවන හා තුන්වන දිස්ත්‍රික් ලෙස වාර්තා විය. එසේම වතුකරයේ ගැබිණි මාතාවන්ගේ රක්තහීනතාව 16.2%ක් ලෙස වාර්තා වන අතර කිරිදෙන මව්වරුන්ගෙන් 19%ක් රක්තහීනතාවෙන් පෙළෙන බවද වාර්තා විය.

මෙම සංඛ්‍යාලේඛන මගින් ඔප්පු කරන්නේ අපේ රටේ පැනනගිමින් එන දැවැන්ත ආහාර හිඟයයි. එක් පසෙකින් දිනෙන් දින ඉහළ යන බඩු මිල, විදුලි බිල, ජල බිල, දුරකථන ගාස්තුය. අනෙක් පසින් දැවැන්ත වැටුප් කප්පාදුව හා රැකියා අහිමි වීම මෙම අර්බුදය තවත් තීව්‍ර කරන්නේය.

එසේම මාස් කන්නය ආරම්භ වුවද කුඹුරට බැසීමට තවමත් දෙගිඩියාවෙන් සිටින ගොවිජනයා කියන්නේද ආහාරවල ඇති අනාගත අවිනිශ්චිතතාවයමයි. මාස් කන්නයේ වී වගාවේ ඇති අවිනිශ්චිතතාවය පැන නගිමින් ඇති ආහාර හිඟය තවත් තීව්‍ර කිරීමට හේතු වන්නේය.

මෙසේ දිනෙන් දින වර්ධනය වන අපේ රටේ ආර්ථික අර්බුදය, සමාජ ප්‍රශ්න තීව්‍ර කිරීමට හේතු වී ඇත. පසුගියදා පඩුවස්නුවරදී එදිනම උපන් දරුවෙකු මහමඟ දමා යන්නේ මේ අර්බුදය නිසාමය. මංකොල්ලයකට සම්බන්ධ වූ පොලිස් නිලධාරීන් පිරිසක් පසුගියදා කොට්ටාව පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලබන්නේ මේ අර්බුදයේ බරපතලකම කියාපාමිනි.

මෙසේ වර්ධනය වන සමාජ ප්‍රශ්න අපේ ජීවිත උදුරාගන්නා තත්වයට පත්වන්නේ ඉතා වේගයෙන් බව තේරුම්ගත යුතුය. මේ නිසාම දැන් ජනතාවට ඉතිරිව ඇත්තේ මේ අසමත් පාලනයට විරුද්ධව සටන් කිරීම පමණි. ඒ අරමුණින් සටන් කරන බලවේග හා සංවිධාන වෙත මර්දනය මුදාහැරීම වත්මන් ධනපති පාලකයන්ගේ උපක්‍රමය බවට පත්වී ඇත. ඒ බව පසුගියදා ඇති වූ විරෝතාවලට ආණ්ඩුව දැක්වූ ප්‍රතිචාර මගින් මනාවට ඔප්පු වී ඇත.

කෙතරම් මර්දනය මුදාහැරියද තරුණයින්ට, ගොවියන්ට, වැඩකරන ජනතාවට, කාන්තාවට, පූජ්‍ය පක්ෂයට දැන් සටන් කිරීම හැර වෙන මඟක් නොමැත. මන්ද දැන් ගොඩනගාගෙන ඇති පාර්ලිමේන්තු බලයේ විකෘතිය බිඳදැමීම කළ හැකි වන්නේ ඉක්මන් මැතිවරණයකට යෑම මගින් පමණි. එවැනි ඉක්මන් මැතිවරණයක් පැවැත්වීමට මෙම පාලකයන්ගේ කිසිදු සූදානමක් නැත. ඒ, එසේ මැතිවරණයකට යෑම ඔවුන්ගේ පරාජය ඔවුන් අතින්ම ලියාගැනීමක් බව මෙම ධනපති පාලකයින් හොඳින් දන්නා කරුණක් නිසාවෙනි.

මේ නිසා මෙම පාර්ලිමේන්තුව විසුරුවාලීමට බලකරන දැවැන්ත ජනතා නැගිටීමක් සිදුවීම මේ මොහොතේ අවැසිමය. මේ නිසා එක්සත්ව මර්දනය පරයා යා හැකි දැවැන්ත ආරම්භයක වුවමනාව කැකෑරෙමින් ඇත. ඒ වෙනුවෙන් සංවිධානය වෙමු! ශක්තිමත් වෙමු!!

# තාරුණ්‍යයේ හීන වළ දැමූ පාලකයිනි, වහා ඉල්ලා අස්වනු!

සැප්තැම්බර් 24 ලාංකේය තාරුණ්‍යයට අලුත් ආරම්භයක් විය. සමාජවාදී තරුණ සංගමය විසින් ලිප්ටන් වටරවුමේ සිට කොළඹ කොටුව දක්වා උද්ඝෝෂණ පාගමනක් සංවිධානය කළ අතර එය අරගලයේ නව හැරවුම් ලක්ෂයක් වූ බව නිසැකය. "අරගලයට නව ජවයක්" එම විරෝධතාවයේ තේමාව විය. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම වූයේ, "තාරුණ්‍යයේ සිහින වළ දැමූ පාලකයිනි, මර්දනය හකුළාගනු! වහා ඉල්ලා අස්වෙනු!" යන්නයි.

මේ වන විට රට තුළ විශාල බේදවාචකයන් රැසක් ගොඩගැසී ඇත. උදය ආහාර වේලක් නොමැතිව පාසල් ළමෝ ක්ලාන්තයට ලක්වන තත්වයට පත්ව සිටිති. ගමන් වියදම් දරාගත නොහැකිව පාසල් නොයන ළමුන් ඉතා වේගයෙන් වැඩි වී තිබේ. එසේම රටේ උද්ධමනය විශාල ලෙස ඉහළ යමින් පවතී. රටේ තාරුණ්‍යයේ සිහින වළපල්ලට ඇදවැටෙමින් තිබේ. ගෙයක් දොරක් සදාගැනීම, වාහනයක් ගැනීම, ඉඩමක් ගැනීම සිහිනයක් පමණක් වෙමින් ඇත. රැකියා අහිමි වීම විසින් ඔවුන්ගේ අනාගතය අඳුරු ආගාධයකට ඇද වට්ටමින් තිබේ. දරාගත නොහැකි අන්දමින් බඩුමිල ඉහළ යෑම නිසාත් රෝහල්වල බෙහෙත් නොමැතිකම නිසාත් ජනතාවගේ ජීවිත දැඩි අවදානමකට ලක්ව ඇත.

මේ සියලු කාරණා පෙරටු කරගනිමින් සමාජවාදී තරුණ සංගමය සැප්තැම්බර් 24 උද්ඝෝෂණයක් සංවිධානය කළේ අරගලයේ ඊළඟ පියවර ලෙසිනි. රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ඊට පෙර පැවැති විරෝධතා මර්දනය කරමින් සිටි අතර මෙම උද්ඝෝෂණයට අධිආරක්ෂිත කලාප ප්‍රකාශයට පත් කරමින් බාධා පමුණුවන ලදී. නමුත් එය බාධාවක් නොකරගනිමින් එදින උද්ඝෝෂණ පාගමන සංවිධානය විය. ලිප්ටන් වටරවුමෙන් ඇරඹි පාගමන ඩීන්ස් පාර ඔස්සේ කොටුව දක්වා ගමන් ආරම්භ කළේය. එහෙත් පාගමනට ඩීන්ස් පාරේ වැඩි දුරක් යාමට ඉඩ නොලැබිණි. පොලීසිය විසින් පාර හරස්කොට බාධා ඇතිකළේය. ඔවුන් නිවේදනයක් කරමින් පැවසුවේ මෙම පාගමන නීති විරෝධි බවය. නමුත් නීතිඥවරුන් මැදිහත්වී එම විරෝධතාවයේ නිතී විරෝධී පදනම පවසන ලෙස ඉල්ලූ මොහොතේ ඔවුන්ට දීමට පිළිතුරක් නොවීය. අවසානයේ ඔවුන් පිළිතුරු දුන්නේ කැරලි මර්දන ඒකකය ලවා ජල ප්‍රහාර, කඳුළු ගෑස් හා බැටන් පොලු ප්‍රහාර දියත් කරමිනි. දිගින් දිගට ප්‍රහාර එල්ල කල පොලීසිය විසින් සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ඇතුළු 84 දෙනෙක් අත්අඩංගුවට ගන්නා ලදී. මේ පිරිස අතරට නීතිඥවරු හා මාධ්‍යවේදීහුද ඇතුළත්ව සිටියහ. පොලිස් පහරදීම්වලින් හත්දෙනෙකු රෝහල් ගත කෙරිණි. අනතුරුව නව නගර ශාලා පරිශ්‍රය වෙත පිවිසි උද්ඝෝෂකයෝ රැලියක් පවත්වමින් එම විරෝධතාවය අවසන් කළහ. ආණ්ඩුව කෙතරම් මර්දනය යෙදුවද අරගලය අත්නොහරිමින් සිදුකරන ලද මෙම තරුණ විරෝධතාව ලාංකේය අරගලයට මෙන්ම රටේ තාරුණ්‍යයට නව ජවයක් හා ආදර්ශයක් තැබූ බව සටහන් තැබිය යුතුමය.





# ආදරණීය චේ...




ආදර්ශ, පරමාදර්ශ  
බොහෝමයක්  
ඉතිහාසයේ,  
අනාගත පෙරවදන්...  
කල්පයක යුතුකම්  
නිම කළ...  
ජීවිතේ ටික කලක්...  
මහාප්‍රාණයෙන් නොවූ  
අල්පප්‍රාණ, සරල, සුනම්‍ය  
පරමාදර්ශය, චේ...  
සහස් වසක, කල්පයක  
නොනවතින  
සදාතනික ස්නේහයක්...  
ප්‍රේමයක කැටපතක්...  
නිර්ධනීන් සවනත  
රැව්පිළිරැව් දුන්  
ප්‍රවාහයකි නුඹ  
දනන් නිදි බිඳින  
අදටද...  
මියුරුසර වන් වදන් වැකි  
ධෛර්යය හා මුසුකළ  
සටන්කාමීත්වයේ අග්‍රය  
පසක් කළේ නුඹය...  
ආදරණීය චේ...  
මතුවටත්,  
පරමාදර්ශයේ  
ආකල්ප ධාරාවකි නුඹ...

**(ඔක්තෝබර් 08 දිනට යෙදෙන චේ සමරුව වෙනුවෙනි)**

## කොරල්පර මුද්‍රණ යන්ත්‍ර නමක් ගන්න ලෑස්තිද?

කොරල්පර විනාශවීම සමග සාගර විවිධත්වයටත්, මිනිසාට විශාල බලපෑමක් එල්ලවෙමින් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉතිරිව ඇති ගල්පර පද්ධති පවත්වාගෙන යාමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමට නව සහ වැඩිදියුණු කළ ක්‍රම ඉදිරිපත් කිරීමට සංරක්ෂණවාදී වෙහෙස මහන්සි වෙති. සයන්ස් ඔෆ් ද ටෝටල් එව්රන්මන්ට් සඟරාවේ ප්‍රකාශයට පත් කරන ලද නව පත්‍රිකාවකින් සංරක්ෂකයින් විසින් කෘතිම ගල්පර තැනීම සඳහා ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර භාවිත කරන ආකාරය හෙළි කරයි.

පත්‍රිකාවේ පැහැදිලි කර ඇති පරිදි, ක්‍රියාවලිය ආරම්භ වන්නේ පවතින ගල්පරය එහි මූලික ලක්ෂණ හඳුනාගෙන ඒවා හැකිතාක් සමීපව අනුකරණය කිරීම සඳහා ස්කෑන් කිරීමෙනි. ඉන්පසුව, ටෙක්නියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි සමඟ එක්ව සාදන ලද අභිරුචි මුද්‍රණ යන්ත්‍රයක් භාවිතා කරමින්, ගල්පරය සකස් කර ඇත.

වාණිජ ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍රවල බහුලව භාවිතා වන ප්ලාස්ටික් සූත්‍රිකාව වෙනුවට, ගල්පර මුද්‍රණ යන්ත්‍රය ටෙරාකොටා මැටි භාවිතා කරයි, එය සිදුරු සහිත සහ කොරල් ඇල්ගීවලට අනුග්‍රහය දක්වයි. එපමණක් නොව, ස්වභාවධර්මයේ දක්නට ලැබෙන ව්‍යුහාත්මක විවිධත්වය පවත්වා ගනිමින් කොරල්පරවල විශාල කොටස් නැවත ගොඩනැංවිය හැකි පරිදි මුද්‍රිත ගල්පර මොඩියුලර් සහ ගොඩගැසිය හැක.

## ඇපල් ස්මාර්ට් වතුර බෝතලය



Apple හි ස්මාර්ට් ජල බෝතලය Apple Watch සහ Apple Health සමඟ ඒකාබද්ධ වේ. කෙනෙකුට අවශ්‍ය ජල ප්‍රමාණය ගණනය කිරීමට (ඇපල් එකකට) ඔහුගේ හෝ ඇයගේ දෛනික පියවර සහ ව්‍යායාම සැලකිල්ලට ගනී. බෝතලයේ පතුලේ ඇති LED පැක් එක ඔබට බීමට වේලාව පැමිණි විට  මතක් කිරීමට දැල්වෙන අතර බ්ලූටූත් භාවිතයෙන් කෙනෙකු දවස පුරා වතුර අවුන්ස හෝ මිලිමීටර කීයක් පානය කරනවාද යන්න නිරීක්ෂණය කරයි. HidrateSpark Pro Tritan Plastic Sea Glass ආකාරයෙන් පරිවරණයකින් තොරව තරමක් මිලෙන් අඩු අනුවාදයක්ද ලබා ගත හැකි බව වාර්තාවේ.

මූලික පැවැත්මේ කාර්යයන් ක්ෂුද්‍ර කළමනාකරණය කිරීමට කෙනෙකුට කවදා හෝ විචිත්‍රවත් ක්‍රමයක් අවශ්‍ය නම්, HidrateSpark Pro ජල බෝතලය ඉදිරිපත් කළ හැකියි.

# බහුජාතික සමාගම් කිහිපයකට රටේ ආර්ථික හා දේශපාලන බලය ලබාදීමේ සැලසුම පරාජය කළ යුතුයි

(සැප්තැම්බර් 14වැනි දින කොළඹ පදනම් ආයතනයේදී සංවිධානය කරන ලද 'විකුණන කතාවේ සඟවන ඇත්ත' සම්මන්ත්‍රණයේදී ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා විසින් පළ කරන ලද අදහස්වල සංක්ෂිප්ත සටහනකි)



රාජ්‍ය ආයතන පෞද්ගලිකරණය කළ යුතුයි කියන මාතෘකාව අද අලුත් වටයකින් සාකච්ඡාවට ඇවිත් තිබෙනවා. මේ කතිකාව ජනප්‍රිය වෙමින් තිබෙනවා. තෙල් මිල, ගෑස් මිල ඉහළ යනකොට කෙනෙකුට දැනෙනවා මේ ආයතන තමයි අපිව විනාශ කරන්නේ කියලා. ඒ නිසා මේ ආයතන විකුණා දමන්න ඕනෑ යන අදහස යම් ප්‍රමාණයකට මතුවෙමින් තිබෙනවා. අපි පළමු බැලුවොත් මේ ආණ්ඩුවට ලැබුණු ජනවරම මොකක්ද? හම්බන්තොට වරාය විකුණන වෙලාවේදී මහින්ද රාජපක්ෂ පවසා සිටියා, "මෛත්‍රීපාල - රනිල් හවුල් ආණ්ඩුව විකුණන ඒවා ගන්නේ බලාගෙනයි. අපි ආවාම ඒවා ආපහු ගන්නවා. හම්බන්තොට වරාය නැවත පවරා ගන්නවා" කියලා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වී, පළමු සංචාරය ගියේ ඉන්දියාවට. එහිදී ප්‍රකාශ කර සිටියා, 'හම්බන්තොට වරාය විකිණීම පිළිබඳ ගිවිසුම නැවත සමාලෝචනයට ලක්කරන බව'. රාජපක්ෂ ආණ්ඩුවේ ජනවරමේ සංයුතිය වුණේ රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීමයි. ඒ ජනවරමට ප්‍රතිපක්ෂව සිටියේ රනිල් වික්‍රමසිංහ. රනිල්ගේ ජනවරමට ලැබුණේ ජාතික ලැයිස්තුවෙන් එකම මන්ත්‍රී ධුරයක් පමණයි. ඔහු කොළඹ දිස්ත්‍රික්කයේ නායක ලෙස ඉදිරිපත් වූවත් ඔහුව තෝරා ගැනුණේ නැහැ. මේ වන විට ජනතාව විසින් ප්‍රතික්ෂේප කරන ලද රනිල්ගේ න්‍යාය පත්‍රය රාජපක්ෂ කඳවුරේ න්‍යාය පත්‍රය බවට පත්කර ගෙන තිබෙනවා. මේ විකිණීමේ කතාව එක් පැත්තකින් 2019දී සහ 2020දී ලැබුණු ජනවරමට පටහැණියි.



## විකිණීමේ පුරාණය

මේ විකිණීම පිළිබඳ සාකච්ඡාව දීර්ඝ කාලයක් පුරා විවිධ පැතිවලින් එනවා. ගොඩක් ආයතන වික්කා. විජේපාල මෙන්ඩිස් ඇමතිව සිටි කාලයේ 1987 පමණ අපේ පේෂකර්මාන්ත ශාලා විකුණා දැමුණා. ඔහුගෙන් තමයි රාජ්‍ය දේපළ විකිණීම ආරම්භ කළේ. රට තුළ අවශ්‍ය වෙන රෙදිවලින් විශාල පංගුවක් අපි නියෝජනය කරමින් තිබුණා. තුල්හිරිය, මත්තේගොඩ, පූගොඩ, වේයන්ගොඩ රෙදි ජනපද තිබුණා. මේවා වසර 35ක අතීතයක ආරම්භයක් නිසා තාක්ෂණය පහළ මට්ටමකත් ගුණාත්මකභාවයෙහිත් අඩුවක් තිබුණා. මේ විකිණීම නිසා පරිභරණය සඳහා අවශ්‍ය රෙදි විශාල පංගුවක් ආනයනය කරන්න සිදුවුණා. මත්තේගොඩ වැහුණා, පූගොඩ පාළුවට ගියා. වේයන්ගොඩ පාළුවට ගියා. ඊළඟ විකිණීම සිදුවුණේ වතුවලයි. රාජ්‍ය වතු අත්හැරියා. අවසානයේ එහි ප්‍රතිඵලයක් ලෙස ඒවායේ වැඩ කරන සේවකයෙකුට රුපියල් 1000ක වැටුපක් දෙන්න බැහැ කියනවා. ඒ පෞද්ගලිකරණයෙන් අත්පත් කරගත් දියුණුව කුමක්ද? සේවකයෝ රුපියල් 1000ක වැටුපක් ඉල්ලීම නිසා හාම්පුතාලා නඩුවක් දැම්මා. එයින් ජනතාවට ලැබුණ ප්‍රතිලාභය කුමක්ද?

අපේ කඩදාසි කර්මාන්ත ශාලාව දියුණුවෙමින් තිබුණා. වාලච්චේන, යුද්ධය හේතුකොටගෙන කඩා වැටුණත් ඇඹිලිපිටියේ කඩදාසි කම්හල පවත්වාගෙන යමින් තිබුණා. එය විකුණා දැමුණා. අද රට තුළ අභ්‍යාස පොත් නැති බවටත් ප්‍රශ්න පත්‍රයක්, පත්තරයක් මුද්‍රණය කර ගැනීම අසීරු බවටත් විශාල අඥෝනාවක් නැගෙමින් තිබෙනවා. වරක මෙය නැවත පවරා ගත්තත් නැවතත් විකුණුවා. සමහර ඉඩම් සහ මැෂින් බැංකුවට උකස් කොට ආයෝජකයින් පැනලා ගියා. එම විකිණීමෙන් ලැබූ ප්‍රතිඵලය කුමක්ද? කන්තලේ සහ හිඟුරාන සීනි කර්මාන්ත ශාලා විකුණුවා. කන්තලේ අක්කර 23,000ක් හා පැල තවාන අක්කර 3000කට ආසන්නව තිබුණා. ඒ සඳහා ගැලපෙන කර්මාන්ත පද්ධතියක් තිබුණා. විකිණීමේ ප්‍රතිඵලයක් ලෙස විශාල භූමි ප්‍රමාණයක් පාළුවට ගොස් තිබෙනවා. හිඟුරාන සීනි කම්හල මෑතකදී ආරම්භ කළා. වැලිසර කිරිපිටි කර්මාන්ත ශාලාව විකුණුවා. තුනී ලෑලි සංස්ථාවක් තිබුණා. අද එයත් අපට අහිමි වෙලා තිබෙනවා. දංකොටුවේ පොසිලේන්, පිළියන්දල පෝසිලේන් කර්මාන්ත ශාලා පාළුවට ගොස් තිබෙනවා.

පෞද්ගලිකරණය වෙනුවෙන් මාවතක් තිබෙන අය පළමුව කළ යුත්තේ පෞද්ගලිකරණය කරන ලද ආයතනවල ශේෂ පත්‍රයක් ඉදිරිපත් කිරීමයි. ඔවුන් ටෙලිකොම් පෞද්ගලිකරණය කිරීමේ යහපත් බව නිතර ප්‍රකාශ කරනවා. ටෙලිකොම් පෞද්ගලිකරණයයි, ටෙලිකොම් තාක්ෂණයයි එකට දියුණු වුණේ. මොබයිල් තාක්ෂණය පෞද්ගලිකරණය සමග ලෝකයේ එකට ගැටගැසී තිබෙනවා. 1990දී මාස දෙකක් පමණ ඇප්ලිකේෂන් එකක් පුරවා පෝලිමේ ඉන්න ඕනෑ තමයි. ඒ අවදියේ තිබුණේ වයර්වලින් සන්නිවේදනය ලබාගන්නා තාක්ෂණයයි. වයර්ලස් තාක්ෂණය එනවිට අපි ඒ ආයතන විකුණලා. එය තාක්ෂණ දියුණුවේ ප්‍රතිඵලයක් මිසක් පෞද්ගලීකරණයේ ප්‍රතිඵලයක් නොමෙයි. රාජ්‍ය ආයතන පමණක් තිබුණා නම් හොඳයි කියා අපි ප්‍රකාශ කරන්නේ නැහැ. නමුත් මේ පෞද්ගලීකරණය තමයි ආර්ථිකය සංවර්ධනය කරන මාවතේ දීප්තිමත්ම මාවත ලෙස හුවා දක්වන්න උත්සාහ ගන්නවා. එය බොරුවක්.

## විකුණන්නේ පාඩු නිසාද?

ජනතාව පීඩාවට පත්වෙන කොට ඔවුන් තුළ මතයක් ගොඩනැගෙනවා මේවා විකුණුවත් කමක් නැහැ කියලා. ඒ වගේම මතයක් ගොඩනැගෙනවා රාජ්‍ය ආයතන අකාර්යක්ෂමයි, ඒ නිසා විකුණා දැමිය යුතුයි කියලා. අකාර්යක්ෂමභාවය අපත් පිළිගන්නවා. එහෙත් කළ යුත්තේ විකිණීමද? ඉඩම් නඩුවක් විසඳන්න වසර 20කට වඩා කාලයක් ගත වෙනවා. ඒ තර්කය අනුව අධිකරණ පද්ධතිය අකාර්යක්ෂමයි. පොලීසිය අකාර්යක්ෂමයි. රජයේ අනිකුත් ආයතනත් අකාර්යක්ෂමයි. අකාර්යක්ෂම සියලුම ආයතන

11 වැනි පිටුවට

> මේ වන විට මහ බැංකුවත් පාඩුයි. කැබිනට් මණ්ඩලයත් පාඩුයි. පාඩු ලබන ආයතන විකුණා දැමිය යුතු නම් මේ ආයතනත් විකුණා දැමිය යුතුයි. නමුත් මේ විකුණා දමන්න සූදානම් වන්නේ පාඩු ලබන ආයතන පමණද?


# පරපෝෂිතභාවයේ සංකේතයක් වූ රජපවුල

එංගලන්තයේ දෙවන එලිසබත් රැජිනගේ මරණයත් තුන්වන චාල්ස් රජුගේ අභිෂේකයත් පසුගියදා සිදුවිය. එලිසබත් රැජිනගේ මරණය වෙනුවෙන් ශෝක දිනයක් හා නිවාඩු දිනයක්ද ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකාවේ අටවන ජනාධිපතිවරයා ලෙස සැලකෙන රනිල් වික්‍රමසිංහ රාජකීය අවමඟුලටද සහභාගි විය. එලිසබත් රැජිනගේ මරණය පිළිබඳව අධිපති මාධ්‍යයන් තුළ ගුණ ගායනා හා ගුණ වැණුම් ඉදිරිපත් කෙරෙද්දී එලිසබත් රැජිණිටත් රජ පවුලටත් තුන්වන චාල්ස්ගේ අභිෂේකයටත් එරෙහිව සංවාදයක්ද පැන නැගුණි. පසු කී මතයට අධිපති මාධ්‍යයන් තුළ ඉඩක් නොලැබුණ අතර ඊට ඉඩක් විවර වූයේ සමාජ මාධ්‍ය හා විකල්ප මාධ්‍යයන් තුළ පමණි.

එංගලන්තයේ රාජකීය පවුල රාජ්‍යත්වයේ සංකේතයයි. එංගලන්තය ඇතැම් කොටස් එය තම රටේ අභිමානයක් ලෙසත් රටට විශාල ගෞරවයක් ගෙන දෙන්නක් ලෙසත් සලකන අතර බ්‍රිතාන්‍යයේ අයර්ලන්තය ස්කොට්ලන්තය ආදී ප්‍රදේශවල බොහෝ වැසියෝ එය පීඩනයේ සලකුණක් ලෙසත් සලකති. බ්‍රිතාන්‍ය වැසියන්ගෙන් සැලකිය යුතු තරම් කොටසක් රාජකීය පවුල පරපෝෂිතයන් සේ සලකති; අතීතයට අයත් රාජ්‍යත්වයේ සංකේතයක් තවදුරටත් මහජන මුදලින් නඩත්තු කරලීම නොඉවසති. ඇතැමෙක් ප්‍රකාශ කර සිටියේ රාජ්‍යත්වය දෙවන එළිසබෙත් රැජිනගෙන් අවසන් විය යුතු බවයි. චාල්ස් තුන්වන චාල්ස් ලෙස අභිෂේක නොකළ යුතු බවයි. ජනතාව එංගලන්තයේ රාජකීය පවුල පරපෝෂිතයන් ලෙස හඳුන්වන්නේ හේතු නොමැතිව නොවේ.

බ්‍රිතාන්‍යය තුළ ධනේශ්වර ක්‍රමය බිහි වන්නේ ප්‍රංශයේ මෙන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක ආකාරයෙන් නොව ධනේශ්වර විප්ලවය ලෙසය. එනම්, මූලික වශයෙන් ඉඩම් හිමි රදලයන් සමඟ එකඟතාවයෙන් බලය හුවමාරු කර ගැනීමෙනි. එහෙයින් බ්‍රිතාන්‍ය තුළ වෙනම ඉඩම් හිමි පැලැන්තියක පැවැත්මක් පවතී. රාජ්‍යත්වයේ බලය අඩු කළද රාජ්‍යත්වය හා රාජකීය දේපළ එලෙසම පැවතෙන්නට විය. රැජිනගේ මරණයෙන් පසු අභිෂේක ලද තුන්වන චාල්ස් රජුට දෙවන එලිසබත් රැජිනගේ ඇවෑමෙන් උරුම වන සමස්ත දේපළෙහි වටිනාකම පවුම් බිලියන දාහතක් (ඩොලර් බිලියන 18.46) පමණ වෙතැයි ගණන් බලා තිබේ.

බ්‍රිතාන්‍ය රාජකීය පවුලේ ආදායම ප්‍රධාන මාර්ග තුනක් මගින් ලැබේ. එනම්, 01. රාජකීය වතුයාය 02. Lancaster හි දේපළ 03. Cornwell හි දේපළ ලෙසය.




## රාජකීය වතුයාය

රාජකීය පවුල සතු විශාලතම ඉඩම් හා දේපළ රාජකීය වතුයායන් යටතේ පාලනය වේ. ඊට මධ්‍යම ලන්ඩනයේ සැලකිය යුතු කොටසක ඇති ගොවිබිම්, කාර්යාල සහ උද්‍යාන අයත් වේ. මෙම දේපළ සවුත්හැම්ප්ටන් සිට නිව් කාසල් දක්වා ප්‍රදේශයේ විහිදී ඇත. මීට අමතරව රාජකීය පවුලට උතුරු අයර්ලන්තයේ, වේල්සයේ හා එංගලන්තයේ මුහුදු පත්ල, මුහුදට යාබද වෙරළ තීරයේ අඩකට වැඩි ප්‍රමාණයක් ඊට අයත් වේ. උතුරු මුහුදේ තෙල් නිධි සොයා ගැනීමත් සමඟ හා සුළං විදුලි බලාගාර සඳහා ඉඩම් ලබා දිය හැකි වීමෙන් මෙම ඉඩම්වල වටිනාකම මෑතක සිට වඩාත් ඉහළ ගොස් තිබේ. එසේම රාජකීය වතුයායට අක්කර දහසය දහසක් පුරා පැතිර ඇති වතුද අයත් වෙයි. එකී වතුයායට උද්‍යාන භූමි, පුරාණ වනාන්තර හා ඇස්කොට් තුරඟ තරග පිටියද අයිතිය. 2022 වසරේ ජූනි මාසයේදී නිකුත් කරන ලද වාර්ෂික ගිණුම්වලට අනුව රාජකීය වතුයායට අයත් දේපළවල මුළු වටිනාකම පවුම් බිලියන 15.6 ක් ලෙස ගණන් බලා තිබේ.

මෙම රාජකීය වතුයායේ කාර්යභාරය 'ජාතියේ යහපත සඳහා භාණ්ඩාගාරයට ලාභ උපයා දීම' ලෙස හඳුන්වාදී තිබේ. 2021-2022 මූල්‍ය වසර තුළදී එහි ලාභය පවුම් මිලියන 318ක් විය. රාජකීය වතුයායට අයත් දේපළවල හිමිකාරිත්වය බ්‍රිතාන්‍යය නෝමන්වරුන්ගේ ආක්‍රමණයට ලක් වූ කාලයේ සිට එනම්, ක්‍රි.ව. 1066 දක්වා කාලයක සිට පවතී. 1760 සිට එහි සමස්ත ආදායම ආණ්ඩුව යටතට ගැනීමට ඉඩ ලබා දෙන ලදී. එහෙත් ඒ එසේ ලබා දීමේදී නිශ්චිත වාර්ෂික ප්‍රදානයක් රජ පවුලට ලැබෙන පොරොන්දුව පිටය. 2021-22 වසර සඳහා එකී ප්‍රදානය පවුම් මිලියන 86.3ක් විය. එනම් බ්‍රිතාන්‍යයේ එක් පුද්ගලයකුගෙන් පවුම් 1.29 බැගින් ඔවුන්ට ලබා දීමක් වැනිය. 2017 වසරේදී ඊට පෙර වසර දෙකෙහි රාජකීය වතුවල ලාභයෙන් 15%ක් රජ පවුලට ගෙවනු ලැබූ අතර 2017 වසරේ සිට වසර 10ක කාලයක් ලාභයෙන් සියයට 25ක් ලබා දීමට තීරණය කර තිබේ. එම තීරණය ගෙන ඇත්තේ බකිංහැම් මන්දිරය පවුම් මිලියන 370ක වියදමින් අලුත්වැඩියා කිරීමට හිලව් වශයෙනි.

මෙම ප්‍රදානය නිල සංචාරවල, දේපළ නඩත්තුවල හා රාජකීය නිවාස පවත්වාගෙන යාම සඳහා වන වියදම් පියවීම සඳහා යොදා ගැනේ. රාජකීය පවුලේ ආරක්ෂක වියදම ඉන් ආවරණය නොකෙරෙන අතර ඒ සඳහා යෙදවෙන්නේ මහජන මුදල්ය. මෙම ප්‍රදානය බදුවලට යටත් නොවන මුත් ඊට අදාළ බද්ද ගෙවීමට රාජකීය පවුල ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වී සිටී. බදු මුදල ගෙවනු ලබන්නේ ඔවුන්ගේ අනෙකුත් දේපළවලින් ලැබෙන ආදායමෙනි. රාජකීය වතුයාය කිසියම් පුද්ගලයෙකුගේ දේපළක් නොවේ. එය අයත් වන්නේ රාජවංශයටය. ඒ නිසා එය විකිණීමට හෝ ඉන් ලැබෙන ප්‍රදානයට අයිතිය කීමට හෝ කිසිවෙකුට නොහැකිය.

මීට අමතරව රජ පවුලට ස්කොට්ලන්තයේ කිලෝමීටර් විසි දෙකයි දශම දෙකක් වන මුහුදු තීරයේ මුහුදු පතුලද මුහුදට යාබද වෙරළ තීරයෙන් අඩක්ද හෙක්ටයාර 37,000 (අක්කර 91,000) පමණ ග්‍රාමීය ඉඩම්ද ස්කොට්ලන්තයේ ස්වභාවිකව හමුවන රන් හා රිදීවල අයිතියද හිමිවේ. කෙසේ වෙතත් 2016දී හඳුන්වාදුන් ස්කොට්ලන්ත පනත මගින් මෙම දේපළවලින් උපදින ලාභය මහජන වියදම සඳහා ස්කොට්ලන්ත ආණ්ඩුව වෙත හරවා යැවීමට තීරණය කරන ලදී.

## Lancaster හි දේපළ

මෙම දේපළවලට එංගලන්තයේ සහ වේල්සයේ ඉඩම් හෙක්ටයාර 18,000කට වැඩි ප්‍රමාණයක් අයත් වේ. ඊට නිවාස, වාණිජ දේපළ හා සත්ව ගොවිපළ අයත්ය. මීට අමතරව මධ්‍යම ලන්ඩනයේ කඩසාප්පු, වාණිජ ගොඩනැගිලි, කාර්යාල පරිශ්‍රයන්, නිවාස සහ මූල්‍ය ආයෝජනයන්ද අයත් වේ. තවද දකුණු වේල්සයේ සිට උතුරු යෝක්ෂයර් ප්‍රදේශය දක්වා පැතිරෙන, බ්‍රිතාන්‍ය ගොඩනැගිලි කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය ලෙස සපයන, හුණු ගල් සහ වැලි ගල් නිධිද අයත් වන්නේ මෙම දේපළවලටය. 2022 වසරේ මාර්තුවේ දී Lancaster දේපළවල වටිනාකම පවුම් මිලියන 650ක් පමණ වූ අතර ඉන් පවුම් මිලියන 24ක ආදායමක් රැජිනට ලැබිණි.

## Cornwell හි දේපළ

නිල වශයෙන් මෙම දේපළෙහි අයිතිය හිමිවන්නේ ඔටුන්න හිමි කුමරුටය. මෙම දේපළට එංගලන්තයේ සහ වේල්සයේ කෝරළ විස්සක් පුරා පැතිරුණු හෙක්ටයාර 52,000ක පමණ භූමියක් අයත්ය. ඉන් බොහොමයක් කෘෂිකාර්මික ඉඩම් වන අතර ඊට අමතරව මුහුදු වෙරළ, ගංගා, වනාන්තර, නිවාස හා වාණිජ දේපළද ඒවායේ ඇත. මධ්‍යම ලන්ඩනයේ පිහිටා ඇති ඕවල් ක්‍රිකට් ක්‍රීඩාංගණයත් Dartmoor බන්ධනාගාරයත් අයත් වන්නේ මෙම දේපළටය. මෙහි වටිනාකම පවුම් බිලියන එකක් පමණ වේ. 2002 මාර්තු මාසයෙන් අවසන් වූ මූල්‍ය වසර තුළදී පමණක් පවුම් මිලියන 21ක් ලාභ ලෙස ලැබී තිබේ. චාල්ස් කුමරු ඒ සඳහා වටිනාකමින් සියයට 45ක් ලෙස ස්වේච්ඡාවෙන් ආදායම් බදු ගෙවා ඇති නමුදු මෙම දේපළ අදායම් බද්දට යටත් නොවේ.

## අමතර ආදායම්

මීට අමතරව දෙවන එලිසබත් රැජිනට අයත් පුද්ගලික ධනයක්ද විය. ඒවා අතර ඇබර්ඩීන්ෂයර්හි වතු යායන්ද ඇයගේ රේස් අශ්ව ගාලද වේ. රාජකීය මුද්දර එකතුවේ වටිනාකම පවුම් මිලියන සියයක් ලෙස ගණන් බලා තිබේ.

කෙසේ වෙතත් මේ තොරතුරු හෙළිදරව් වී ඇති දේපළ ප්‍රමාණය පිළිබඳවය. රැජිනගේ දේපළවලින් වැඩි ප්‍රමාණයක් ඉතාම රහසිගතව පවතින බව කියැවේ. එසේ වුවත් 2022 වසරේ බ්‍රිතාන්‍ය යේ Sunday Times ධනවතුන්ගේ ලේඛනයට අනුව රැජිනගේ පෞද්ගලික වත්කම්වල වටිනාකම පවුම් මිලියන 360 කි. එය ඊට පෙර වසරට වඩා පවුම් මිලියන 05ක වැඩි වීමකි.

මාක්ස් මෙම තත්වය සිය ප්‍රාග්ධනය කෘතියේදී පැහැදිලි කරමින් කෘෂි කර්මාන්තයේදී ඉඩම් බදු කුලිය පැනනැගෙන ආකාරය විස්තර කරයි. කෘෂිකර්මාන්තයේදී සාමාන්‍ය ලාභයට අමතරව ඉඩම් බදු කුලියක් පැනනගින්නේ ඉඩම්වල මහා පරිමාණ පෞද්ගලික දේපළ අයිතිය නිසාය. ධනපති ක්‍රමය තුළ මේ ආකාරයේ ඉඩම්හිමි පැලැන්තියක පැවැත්ම නිසාය. ධනපති ක්‍රමය තුළ ඉඩම් හිමි පැලැන්තියක පැවැත්ම විසින් කෘෂිකාර්මික භාණ්ඩවල වටිනාකම හා මිල කාර්මික භාණ්ඩවල වටිනාකම හා මිලට වඩා වැඩි වී තිබේ. ඉඩම් හිමි පැලැන්තිය තම ඉඩම් අයිතිය යොදා ගනිමින් පරපෝෂිත ජීවිතයක් ගත කරමින් එකදු දහඩිය බිඳක් හෝ නොහෙළා වැඩකරන ජනතාවගේ අතිරික්ත වටිනාකම් අත්පත් කර ගනී. එබැවින් එංගලන්තයේ රාජකීය පවුල යනු හුදු රාජ්‍යත්වයේ සංකේතයක් පමණක් නොව පරපෝෂිතභාවයේ සංකේතයක්ද වන්නේය.

## කියුබාව: නව පවුල් පනතට ජන අනුමැතිය



කියුබානු ආණ්ඩුව ඉදිරිපත් කළ නව 'පවුල් පනත'ට එරට ජනතාවගෙන් 66.87%කගේ කැමැත්ත ප්‍රකාශ වී තිබේ. ඒ සඳහා වන ජනමතවිචාරණය සැප්තැම්බර් 25 වනදා පැවති අතර 74.01%ක ප්‍රතිශතයක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි. කියුබානු ආණ්ඩුව හඳුන්වා දුන් නව 'පවුල් පනත' ලොව ප්‍රගතිශීලී, විප්ලවකාරී හා සියලු පැති පිළිබඳ සලකා බැලූ පනතක් ලෙස විශාරදයින්ගේ පිළිගැනීමට ලක්ව් තිබේ. එමගින් LGBTQ අයිතීන්, කාන්තා අයිතීන්, ළමයින්ගේ වැඩිහිටියන්ගේ හා ආබාධිත පුද්ගලයන්ගේ අයිතීන් පවා ආරක්ෂා වී තිබේ.

## ඉතාලිය: අර්බුදය මැද දකුණට හැරී





ඉතාලි පාර්ලිමේන්තු මැතිවරණයේදී දක්ෂිණාංශික ජියෝජියා සෙල්විගේ 'ඉතාලියේ සහෝදරයෝ' පක්ෂය ජයග්‍රහණය කර තිබේ. සැප්තැම්බර් 25 වන දින පැවති මහ මැතිවරණයේදී එකී පක්ෂය 63.9%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට සමත් විය. ඒ අනුව මහජන මන්ත්‍රී මණ්ඩලයේ ආසන 400 න් 119 ඊට හිමිවී ඇති අතර සෙනෙට් සභාව තුළ ආසන දෙසීයෙන් 65 ක් එයට හිමි වී තිබේ. ඉතාලියානු කොමියුනිස්ට් පක්ෂයට කිසිදු ආසනයක් හිමි වී නොමැත. මේ අනුව මෙලනිගේ නායකත්වයෙන් දක්ෂිණාංශික සභාග ආණ්ඩුවක් පිහිටුවීමට බොහෝ සේ ඉඩ තිබේ. 2018 වසරේ පැවැති මහ මැතිවරණයේදීද මේ ආකාරයේ සභාග ආණ්ඩුවක් බිහි කළද එයට එහි මුළු ධූර කාලය අවසන් කළ නොහැකි වූ අතර ඉන්පසු පිහිටවූ සභාග ආණ්ඩු තුනටද සම්පූර්ණ කාලය ගත කිරීමට නොහැකි විය.

## ප්‍රංශය: සෞඛ්‍ය සේවක විරෝධතා රැල්ලක්




පසුගිය සැප්තැම්බර් 22 දින ප්‍රංශයේ සෞඛ්‍ය සේවකයෝ විරෝධතා දිනයක් ප්‍රකාශයට පත් කරමින් රට පුරා නගර ගණනාවකදී විරෝධතා ක්‍රියාමාර්ග යන්හි නිරත වූහ. ඔවුන්ගේ ඉල්ලීම වූයේ වැටුප් වැඩිවීම, කාර්යමණ්ඩල සංඛ්‍යාව ඉහළ දැමීම, වැඩිදියුණු කළ හා ආරක්ෂිත වැඩ පරිසරයක් ලබාදීම, රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම, රෝහල් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීමය. මෙම ක්‍රියාමාර්ගය ප්‍රංශයේ සෞඛ්‍ය සේවක වෘත්තීය සමිති ගණනාවක මැදිහත්වීම මත සිදුකරන ලදී.

## බ්‍රසීලය: ලූලාට යයිද?





බ්‍රසීලයේ මීළඟ ජනාධිපතිවරණයේ පළමු වටය ඔක්තෝබර් 02වැනි දින පැවැත්වීමට නියමිතව ඇත. මේ සඳහා අපේක්ෂකයින් එකොළොස් දෙනෙකු ඉදිරිපත් වී සිටින අතර තීරණාත්මක තරගය හිටපු ජනාධිපති ලූලා ද සිල්වා සහ වත්මන් ජනාධිපති බොල්සෙනාරෝ අතර සිදුවේ යැයි සැලකේ. පළමු වටයෙන් එක් අපේක්ෂකයෙක් හෝ සියයට පනහකට වඩා ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට අසමත් වුවහොත් දෙවන වටය පැවැත්වීමට සිදු වන අතර එය ඔක්තෝබර් 30 දින පැවැත්වීමට කටයුතු යොදා තිබේ. කෙසේ වෙතත් මෙවර ජනාධිපතිවරණයේදී අධිරාජ්‍යවිරෝධී, ප්‍රගතිශීලි අපේක්ෂක හිටපු ජනාධිපති ලූලා ද සිල්වා ජයග්‍රහණය කරනු ඇතැයි මේ වන විට පැවති සියලු සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කර තිබේ.

# ඉහළ යන බඩු මිල හා පහළ යන ජීවිත මිල

එක්සත් ජාතීන්ගේ මානුෂීය ආධාර සම්බන්ධීකරණ කාර්යාලය 2022 ජුනි මස 09 වැනිදා නිකුත් කළ ශ්‍රී ලංකාව පිළිබඳව වාර්තාවේ සඳහන් වන පරිදි ශ්‍රී ලංකාවේ ලක්ෂ 17ක ජනතාව ආර්ථික වශයෙන් අතිශය අපහසු තත්වයක පසුවන බව වාර්තා වේ. එසේම ශ්‍රී ලංකාවේ පවුල්වලින් 86% ක් ආහාර පරිභෝජනය අඩු කර ආහාර වේල් මඟහරින බවද එහි වාර්තා කර ඇත. 1948 න් පසු ලංකාව මුහුණ දෙන දරුණුම ආර්ථික අර්බුදය මෙය බවද එම වාර්තාව විසින් කරුණු පෙන්වා දී තිබේ.

ජෛව විවිධත්වයෙන් ඉතා ඉහළ දූපතක් වන ලංකාවට ආහාර අර්බුදයක් නොවන බව 1680 ගණන්වලදී ඉතිහාස රචකයෙකු වූ රොබට් නොක්ස් පවා පෙන්වාදී තිබුණද, අද වන විට ලංකාව ආහාර අනාරක්ෂිත රටක් බවට පත්වී අවසන්ය. 2019 ගෝලීය ආහාර සුරක්ෂිතා දර්ශකයට අනුව රටවල් 113ක් අතුරින් ශ්‍රී ලංකාව 66වැනි ස්ථානයේ සිට වසර දෙකක් තුළ 2021දී 77 වැනි ස්ථානයට පසුබැස ඇත. එයින් කියන්නේ, ආහාර මිලදී ගැනීමට ඇති හැකියාව, ආහාර සුලබ බව, ආහාරවල සුරක්ෂිතතාව හා ගුණාත්මකභාවය අතින්, ලංකාව තවදුරටත් පහළට ඇද වැටී ඇති බවයි. එසේම මානුෂීය ආධාර අවශ්‍ය අත්‍යාවශ්‍යම ජන කොටසට දැනට ලංකාවේ ජනගහනයෙන් 22%ක් අයත් වන බව එම වාර්තාවේ දක්වා ඇත.



"ධනපති ක්‍රමය ලෝකය මුළුල්ලේම ජයග්‍රහණය ලබා ඇත. එහෙත් මෙම ජයග්‍රහණය, ප්‍රාග්ධනය පරදවා ශ්‍රමය ලබන විජයග්‍රහණයට ප්‍රස්ථාවනාව පමණි."

**ලෙනින්**


**තෝරා ගත් කෘති, 01වැනි වෙළුම, 51 පිටුව**

### ගෝලීය ධනවාදයේ අර්බුදය

ලෝක බැංකු වාර්තා අනුව, 2019 කොවිඩ් වසංගත තත්වය වන විට දැඩි කුසගින්නට ගොදුරු වී සිටි ලෝක ජනගහනය මිලියන 690ක් පමණය. කෝවිඩ්වලින් පසු එම ජනගහනය තවත් මිලියන 100කින් පමණ ඉහළ ගොස් ඇත. මේ නිසා ලෝකයේ 1/6ක පමණ ජනතාවකට ආහාර සඳහා ප්‍රවේශවීමේ (ආහාර ලබා ගැනීමේ) බරපතළ අර්බුදයක් නිර්මාණය වී තිබේ. ලෝක ආහාර අර්බුදය ආහාර නිෂ්පාදනය පිළිබඳව අර්බුදයකටත් වඩා ආහාර මිල ගණන් ඉහළ යාමේ අර්බුදයක් බවට පත්ව ඇත. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වාර්තා අනුව තිරිඟු පිටි මිල 130%කින්ද සෝයා මිල 87% කින්ද හාල් මිල 74%කින් හා බඩඉරිඟු මිල 31%කින් ඉහළ ගොස් ඇත.

2020 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තාව අනුව ලෝකයේ මිනිසුන් බිලියන 2.3කට එනම් සෑම තිදෙනෙකුගෙන් එක් අයකුට ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය අහිමිය. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ දත්තවලට අනුව, ලෝකයේ මිලියන 600ක ජනතාවක් රාත්‍රියට කිසිදු ආහාරයක් නොමැතිව රෑ පහන් කරයි.

මිනිසුන්ගේ පැවැත්මේ මූලිකම අවශ්‍යතාවය වන ආහාර ප්‍රමාණවත් ලෙස සපයා දීමට නොහැකි ලෝකයක් පාලනය කරන ආර්ථික දේශපාලන ක්‍රමවේදයක් තවදුරටත් පැවතිය යුතුවේද යන සාධාරණ ප්‍රශ්නය අපි කාටත් නිතැතින්ම පැනනැගීම අතිශය සාධාරණය.



### ලෝක ධනයට කුමක් සිදුවේද?

ලෝකයේ සෑම රටකම නිපදවන ධනය (wealth) එකට ගත් කල ලෝක ධනය (Globle wealth) ලෙස සලකයි. ධනවාදය යටතේ මෙම ලෝක ධනය රටින් රටට වෙනස්කම් සහිතව නිපදවූවද එක්ව ගත් කළ වැඩිවූවා මිස අඩුවීමක් සිදුව නොමැත. ලෝකයේ නිෂ්පාදිත ධනය වසරින් වසර වැඩිවන වේගයකින් වැඩිවී ඇති අතර සිදුවී ඇත්තේ බෙදීයාමේ අසමානතාවයද එලෙසම වර්ධනය වීමයි.

2021 දී මුළු ලෝක ධනය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 530 ක් බව "බොස්ටන් කන්සල්ටින් ග්‍රෑප්" (Bosten consulting group) ආයතනය පවසයි. 2020දී එය ට්‍රිලියන 510ක් වූ අතර 2019 දී ට්‍රිලියන 360.6කි. 2010 දී ට්‍රිලියන 200කි. 1900 වසරේදී එම අගය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 02ක් පමණය.

වත්මන් ලෝක ධනය සමාන බෙදීයාමක් සිදුවේ යැයි උපකල්පනයක් කළහොත් ලෝකයේ සෑම පුද්ගලයෙකුටම ඩොලර් 77,309ක් හිමිය. (ඩොලරයට රු. 360ක් යයි උපකල්පනය කළහොත් එක් පුද්ගලයෙකුට රු මිලියන 27කුත් තවත් 831,240ක් හිමිය)

ලෝකයේ අති දැවැන්තම අර්බුදය නිෂ්පාදනයේ අර්බුදයකට වඩා එම නිෂ්පාදනයන් සාධාරණ ලෙස බෙදී නොයාමේ අර්බුදයයි. වැඩකරන ජනතාවට තමන් නිපදවන දේ මිලදී ගැනීමට ඇති හැකියාව අහිමි කරනු ලැබ ඇත. ලාභ ගොඩගැසීම වැඩි වන්නට, වැඩි වන්නට මිලදී ගැනීමේ හැකියාව බහුතර ජනතාවට අහිමි කෙරේ. ඒ නිසා වෙළඳපොළ නිෂ්පාදනයන්ගෙන් පිරී ඉතිරී යයි. ධනපති නිෂ්පාදකයාටද තම වෙළඳපොළ පවත්වා ගැනීමට ලාභ අහිමි කර ගෙන මිල අඩු කිරීමට බල කෙරේ. එවිට වෙළඳාමද නිෂ්පාදනයද යළි අර්බුදයට පත් වේ. ඒ නිසා වෙළඳපොළ කඩාවැටීම, බංකොලොත් ආර්ථිකයන් බිහිවීමද වර්තමානයේ අනිවාර්යයක් වී තිබේ.

### ලංකාවේ යථාර්ථය

ඉහත දක්වන ලද ධනවාදී ලෝක ආර්ථික අර්බුදයේ පොදු සාධකයන් එලෙසම ලංකාවටද බලපාන අතර, ලංකාවේ අඳබාල දේශපාලන නායකයින් හා ඔවුන්ගේ දූෂිත නිලධාරීන්ගේ උපදෙස් මත ක්‍රියාත්මක කළ වැරදි ආර්ථික උපායමාර්ග නිසා ලංකාවේ ආර්ථික අර්බුදය දෙගුණ තෙගුණ වී අද පවතින තත්වයට පත්ව ඇත.

### උද්ධමනය

2022 ජූලි මාසයේදී පැවති 66.7%ක් වූ ලංකාවේ ආහාර හා ආහාර නොවන භාණ්ඩවල සාමාන්‍ය මිල උද්ධමනය 2022 අගෝස්තු වනවිට 70.2% ක් දක්වා ඉහළ යන ලදී. මේ වනවිට නිල නොවන පරිදි වාර්තාවන්නේ සැප්තැම්බර් අවසානයේදී ආහාර මිල උද්ධමනය 94%ක් පමන වන බවයි.

උද්ධමනය පිළිබඳව ආර්ථික විද්‍යාත්මක දැනුමක් නැති සාමාන්‍ය ජනතාවට පවා පසුගිය සතිය, මාසය හා අද වන විට පවතින වෙළඳපොළ භාණ්ඩ මිල ගණන් සැසඳීමෙන් මේ අර්බුදය තේරුම් ගත හැකිය. මීට වසරකට කලින් උද්ධමනය සාමාන්‍ය අගය වූයේ 6.7කි. එය අද 94%ක්ව පැවැතීමෙන් අර්බුදය තරම පැහැදිලිය.

### භාණ්ඩ මිල

පසුගිය වසරේ උපරිම මිල රු. 94ක් වූ රතු කැකුළු සහල් කිලෝවක් සැප්තැම්බර් මාසයේදී වෙළඳපොළ මිල රු. 200ක් ඉක්මවිය. එළවළු මිලද එලෙසමය. පසුගිය වසරේදී බෝංචි කිලෝවක් රු. 156ක් විය. එය අද එය රු. 600ක් දක්වා මිල ඉහළ ගොස්ය. ගිය වසරේදී කිලෝවක් රු. 60ක් වූ බතල මේ වසරේදී ග්‍රෑම් 250ක් රු. 60ක් දක්වා මිල ඉහළ ගොස්ය. කිලෝවක් ගැනීමට රු.240ක් ගෙවිය යුතුය.

වසරක් අතර නොව මාසයක් තුළදැ බඩු මිල ඉහළ ගොස් ඇත්තේ රුපියල් සිය ගණනින්ය. ලෝකයේ, රුසියාවේ ඇති වන අර්බුදයන් පිට දමා ලංකාවේ අර්බුදය සාමාන්‍යකරණය කිරීමට වත්මන් දූෂිත පාලකයින් උත්සාහ කළද එය සාර්ථක වී නැත. එයට ප්‍රධාන හේතුව ඇස්පනාපිටම වත්මන් ගෝඨාභය හා රනිල් වික්‍රමසිංහ පාලනයන් විසින් ජනතාව රවටමින් ක්‍රියාත්මක කරන ලද වැරදි ආර්ථික උපායමාර්ග මෙම අර්බුදයේ විශාලතම පංගුවක් නියෝජනය කර තිබීමය.

පසුගිය යල කන්නයට අවශ්‍ය පොහොර සපයා දෙනු වෙනුවට කාබනික පොහොර යෙදවීම සඳහා රසායනික පොහොර එකවරම තහනම් කිරීම, ආහාර නිෂ්පාදනය බිඳ වැටීමට ප්‍රධාන ලෙස බලපාන ලද හේතුවකි. වත්මන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මාධ්‍යයට පවසා ඇති පරිදි, ඉදිරියේදී ශ්‍රී ලංකාවට මෙට්‍රික් ටොන් ලක්ෂ 08ක පමණ සහල් හිඟයක් ඇතිවනු ඇත.

ලංකාවේ සෑම දිස්ත්‍රික්කයම යල මහ දෙකන්නයම වී අස්වනු නෙළිය හැකිව තිබියදී ආහාර නොමැතිව දිනපතා පාසල්වල ක්ලාන්ත වන දරුවන්ගේ ප්‍රමාණය ඉහළ යමින් තිබේ. මෙය ලෝක ආහාර අර්බුදයේ ප්‍රතිඵලයක්ද, නැති නම් වැරදි දේශපාලන තීරණයන්ගේ ඵලවිපාක දැයි නිවැරදිව තක්සේරු කරගත යුතුව ඇත. සමහර ඇමතිහු රට තුළ ඇතිවී තිබෙන මන්දපෝෂණ තත්වය අවඥාවෙන් බැහැර කරමින් සිටිති. නමුත් දරුවන්ගේ පෝෂණ මට්ටම අවම වීමට විසඳුම ඔවුන් කියන ආකාරයට අල බතල මඤ්ඤොක්කා මගින් පමණක් සම්පූර්ණ කළ නොහැකිය. වර්ධනයට කාබෝහයිඩ්‍රේට් පමණක් ප්‍රමාණවත් නොවන බව අට ශ්‍රේණියේ සෞඛ්‍ය පාඩම දන්නා දරුවන් පවා හොඳින් දන්නා කාරණයකි. නමුත් ඇමතිවරු ආණ්ඩුවේ සුර සැප විඳිමින් දරුවන්ට අල බතල වවාගෙන කාපල්ලා යැයි කියමින් විහිළු කරමින් සිටිති.

> ලංකාවේ සෑම දිස්ත්‍රික්කයම යල මහ දෙකන්නයම වී අස්වනු නෙළිය හැකිව තිබියදී ආහාර නොමැතිව දිනපතා පාසල්වල ක්ලාන්ත වන දරුවන්ගේ ප්‍රමාණය ඉහළ යමින් තිබේ. මෙය ලෝක ආහාර අර්බුදයේ ප්‍රතිඵලයක්ද, නැති නම් වැරදි දේශපාලන තීරණයන්ගේ ඵලවිපාක දැයි නිවැරදිව තක්සේරු කරගත යුතුව ඇත.

### සමාජ අර්බුද රැල්ල

ආර්ථික අර්බුදයක ඍජු අනිවාර්ය ප්‍රතිඵලයට දැන් ලාංකේය සමාජය ගමන් කරමින් සිටී. ඒ, ආර්ථික පීඩාව දරාගත නොහැකි ජනතාව තමන් තනිවම ජීවත්වීමට දරන උත්සාහයේ ප්‍රතිඵල ලෙස සිදුවන අපරාධ රැල්ලයි. දැන් බත් මුට්ටියේ සිට ගෙලබැඳි මාල කඩා ගැනීමට දරන උත්සාහයන් දක්වාම මිනිස් ජීවිත බිලිගනිමින් තිබේ.

දිනපතා සිදුවන ඝාතන, මත්ද්‍රව්‍ය, අපරාධ, මංකොල්ලකෑම්, දිවිනසාගැනීම් සියල්ල කියාපාන්නේ එකම කතාවකි. ඒ අන් යමක් නොව මේ දූෂිත සමාජ ආර්ථික ක්‍රමය තවදුරටත් ජනතා අභිලාෂ ඉටු නොකරන බවයි. මේ දරාගත නොහැකි අසමාන සමාජ ක්‍රමය වෙනස් කළ යුතු බවයි. ධනවාදය සමාජ ක්‍රමයක් ලෙසටම අසාර්ථක සේම ලංකාව තුළදී වැඩිවන බඩු මිල ජන ජීවිතවල වටිනාකම තුට්ටු දෙකටත් පහළට දමා ඇත. දුෂ්ටත්වය පරාජය කිරීම හැර අන් විසඳුමක් නැති බව දිනපතා අත්දැකීම් විසින් ජනතාවට ඒත්තු ගැන්වෙමින් තිබේ.



# කුණාටුවට පෙර ගොඩට එමු

ලංකාව ආර්ථික අර්බුදයේ හිණි පෙත්තට ළඟාවී ඇති මොහොතක, එහි තවත් එක් අනිවාර්ය ප්‍රතිවිපාකයනට අපි මුහුණ දී සිටිමු. ඒ ළමා මන්දපෝෂණය ඉහළ යාමයි. එය නිකම්ම නිකම් ඉහළ යාමක් නොවේ. ළමා මන්දපෝෂණය අතින් ලොව 6වැනි ස්ථානයට පත්වීමේ ලෝක වාර්තාවක්ද සමගිනි. දිනෙන් දින ඉහළ යන ආහාර උද්ධමනය පොදු ජනතාවට දරාගත නොහැකි තරම් බව වටහා ගැනීමට තවත් සාක්ෂි අවශ්‍ය නොවේ.

පවුලක ආර්ථික අපහසුතාවය වෙනුවෙන් කැප කරන්නනට සිදුවන්නේ දරුවන්ගේ කිරි වීදුරුව, බිත්තරය හෝ වෙනත් ප්‍රෝටීන් ආහාර බව අපි මීට පෙරද සඳහන් කර ඇත්තෙමු. ලංකාවේ ජනගහනයෙන් මිලියන 5.7කට ප්‍රමාණවත් ආහාර වේලක් නොලබන තත්ත්වයකට පත්ව ඇති අතර, එයින් මිලියන 2.3ක ප්‍රමාණයක් ළමුන් වීම ඛේදනීය තත්වයකි. එයට හේතුව වන්නේ ආහාර උද්ධමනය හේතුවෙන් බොහෝ පිරිසක් ආහාර වේල් ගණන අඩුකරති. නොඑසේ නම් ප්‍රමාණාත්මකව ලබා ගන්නා ආහාර ප්‍රමාණය අඩු කරති. එසේම ආහාර වේලකට යන වියදම අඩුකර ගැනීම සඳහා ගුණාත්මක ආහාර වේලක් ලබා ගැනීම අවම කර ගනිති. මේ සියලු කරුණු මත මන්දපෝෂණය තත්වය වර්ධනය වීම සිදුවේ.

මෙවැනි තත්වයක සෘජු බලපෑම එල්ල වන්නේ ළදරුවන්ට හා ළමුන්ට බව වෛද්‍යවරු පවසති. එසේම ගර්භණී මව්වරුන්ට එල්ලවන බලපෑම මත නුපන් දරුවන්ද මෙම ඛේදජනක ඉරණමේ පහසු ගොදුරු බවට පත්වේ. යුනිසෙෆ් සංවිධානය (UNICEF) ඇතුළු සංවිධාන ගණනාවක්ද අපේ රටේ පවතින මේ භයානක තත්වය පිළිබඳ කාලයක සිට අනතුරු හඟවමින් සිටී. නමුත් පාලකයෝ මුනිවත රකිමින් හිඳිති.

රටක අනාගතය තීරණ කරන ළමා පරපුර මන්ද පෝෂණයට ගොදුරු වීම තුළ රටේ ඉදිරි ගමන පිළිබඳ ඇත්තේ අවිනිශ්චිත තත්වයකි. මන්දපෝෂණය යනු දීර්ඝ කාලයක් පුරා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් නොලැබීමෙන් ඇති වන තත්වයයි. ළමා මන්දපෝෂණය අතින් ලොව 06 වැනි ස්ථානයට පත්වීම දිගුකාලීනව පෝෂණය නොලැබීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මන්දපෝෂණය නිසා බුද්ධි මට්ටම ඌණ වීම සිදුවීම බරපතළ ගැටලුවකි. එසේම කුරු බව ඇතිවීම, බුද්ධි මට්ටම හීන වීම, සංජානන ආබාධ, සමාජශීලී බව අඩුවීම, පෞරුෂ වර්ධනය අඩාල වීම, ශක්ති සම්පන්න බව අඩුවීම මෙන්ම, මාංශ පේශිවල වර්ධන අඩපණ වීමද සිදුවේ. සමස්තයක් ලෙස මෙය කායික හා මානසික සෞඛ්‍යයට දැඩි බලපෑමක් එල්ල කරන තත්වයකි.

මෙය සුළුවෙන් සැලකිය යුතු අර්බුදයක් නොවේ. ලංකාව මේ වන විට සුඩානය, සෝමාලියාව, යේමනය ආදී රටවල්වලටත් වඩා දරුණු තත්වයේ ඇති බව UNICEF ශ්‍රී ලංකා නියෝජිත ක්‍රිස්ටියන් ස්තූග් මහතා ප්‍රකාශ කර තිබේ.

මෙය ඊයේ, පෙරේදා හදිස්සියේ ඇති වූ තත්ත්වයක්ද නොවේ අද දවසේ මන්දපෝෂණය සම්බන්ධයෙන් කතිකාව වැඩිපුර කරළියට පැමිණයත් එහි ඉතිහාසය දිගුය. ඊනියා නිදහසට පෙර තත්ත්වය මදක් පසෙක තැබුවත් එයට පසු වසර 74කට අධික කාලයක් රට පාලනය කළ අයවළුන්ගේ පාලනයේ තාර්කික ප්‍රතිඵලය වී ඇත්තේ මෙවැනි ඛේදවාචකයන්ය.

පසුගිය 2019 වසරේ පැවති ජනාධිපතිවරණය ඉලක්ක කර ගනිමින් " අර වැඩේ - ඔබේ ඡන්දය අපේ දරුවන්ට" යනුවෙන් පොත් පිංචක් යුනිසෙෆ් සංවිධානය විසින් එළිදැක්වීය. එහි 15 වැනි පිටුවේ ඒ මොහොත වනවිට පැවති දරිද්‍රතාව සම්බන්ධයේ මෙසේ සඳහන් වේ "ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික සම්පත් බෙදී යාමේ විෂමතාව රට පුරා දරුවන් මුහුණ දෙන වෙනත් අසමානතා යම්තාක් දුරට පැහැදිලි කරන්නට සමත්ය. දරිද්‍රතාව පවතින ප්‍රදේශවල මාතෘ, ළදරු හා ළමා මන්දපෝෂණ තත්ත්වය තුළින් විද්‍යමාන වන්නේ එකී ප්‍රදේශ දුර්භික්ෂ තත්ත්වයකට ළඟා වෙමින් තිබෙන බවකි.(දිස්ත්‍රික් වශයෙන් ගත් කළ මොණරාගල 25.45% ක්ද හම්බන්තොට 21.8% ක්ද වශයෙන්ද දැක්වෙන මෙකී මන්දපෝෂණ ප්‍රතිශතය දකුණු සුඩානයේ ළමා මන්දපෝෂණ ප්‍රතිශතයට ආසන්නය). අප්‍රමණාවත් පෝෂණය හේතු කොට ගෙන දරුවකුගේ ජීවිතයෙහි මුල් දින 1000 තුළදී (වයස අවු.0-2) ඇති වන වර්ධන ඌණතාව බොහෝ දුරට අතිශය දුගී ප්‍රදේශවලදී බහුලව දක්නට ලැබෙන්නකි. සියයට 34.2ක් වන නුවරඑළිය දිස්ත්‍රික්කයේ වර්ධන ඌණතා අනුපාතය නයිජීරියාවෙහි පවතින තත්ත්වය හා සමානය"

මෙහි හාස්‍යජනකම කරුණක් වන්නේ ජාතියේ අප්පච්චිලා වූ රාජපක්ෂලාගේ නිජ භූමිය වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළමා මන්දපෝෂණ ප්‍රතිශතය දකුණු සුඩානයේ ළමා මන්දපෝෂණ ප්‍රතිශතයට ආසන්න වීමය.

මන්දපෝෂණය යන කාරණයට සම්බන්ධයෙන් වැඩිපුරම කථාබහට ලක්වන්නේ දරුවන් ගැන වුවත් මෙහිදී මව අමතක කළ නොහැක.බොහෝ විට පවුලක අන්තිමට ආහාර ගනු ලබන්නේ මවයි. ස්වාමි පුරුෂයාට සහ දරුවන්ට කෑම බෙදා වෙන්කළ විට ඉතිරි වුවහොත් ඇයටය. සියලු පෝෂ්‍ය පදාර්ථ එනම් මස් කෑල්ල, මාළු කෑල්ල, බිත්තරය ආදීය වෙන් වන්නේද එසේමය. එක පැත්තකින් අපේ සංස්කෘතික කාරණාද මව මේ තත්වයට පත්වීමට බලපා ඇත. එබැවින් ආහාර උද්ධමනය සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින මෙවැනි වටපිටාවක දරුවන්ගේ මෙන්ම මවගේ පෝෂණ තත්වයද ඉතාමත් දරුණු අන්දමින් පහළ වැටෙමින් තිබේ. අනෙක් පැත්තෙන් රටට ඩොලර් උපදවන තේ කර්මාන්තය ආශ්‍රිතව සහ වෙළඳ කලාපවල මෙන්ම පෞද්ගලික අංශයේ සේවය නියුතු කාන්තාවන්ගේ පෝෂණ තත්වයද හැකිළෙමින් පවතී. රටක කාන්තාවන්ගේ හා ළමුන්ගේ මේ පෝෂණ තත්වයන් පහළ වැටීම ඉදිරි අනාගතයේදී රටේ ඉදිරි ගමන වෙනුවෙන් කෙසේ බලපානු ඇද්ද?

එබැවින් කාන්තාවන් ලෙස මේ ප්‍රශ්නය වඩාත් සංවිදී වන්නේ අපටය. නමුත් මේ හමුවේ අප කඳුළු සලමින් සිටියහොත් තත්වය වඩාත් දරුණු වනු ඇත. එසේ නම් මේ තත්ත්වය උදාකළ පාලකයන්ට තවදුරටත් මේ රට විනාශ කිරීමට ඉඩ නොදිය යුතුය. ඉදින් අපි කුසගින්නේ වුව සිට මොවුනට එරෙහිව රොද බැඳිය යුතුමය.

## දේශපාලනය තේරුම් ගැනීම අපේ වගකීමයි



වුායි කැලී බල්තසාර්
ජාතික ජන බලවේගය
විධායක කමිටු සාමාජිකා,
සමාජ ක්‍රියාකාරිනී

ලෝක ආහාර වැඩසටහන සැප්තැම්බර් 19 පළ කරන ලද සමීක්ෂණයකට අනුව, ලංකාවේ නිවාසවලින් 79%ක් පෝෂණය නොසලකා හරිමින් තම ආර්ථික තත්වයට සරිලන මිල අඩු ආහාර පරිභෝජනයට පෙළඹී තියෙනවා. ගෙවල්වල පරිභෝජන රටාවන් සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. ජනගහනයෙන් 49%ක් ගන්න ආහාර ප්‍රමාණය අඩුකරලා. තවත් 39%ක් ගන්න ආහාර වේල් සංඛ්‍යාව අඩුකරගෙන.

මේ තත්වය මත, ලංකාවේ දරුවන්ගෙන් 1/5 කට මන්දපෝෂණය. ගර්භණීය අම්මලාට නිසි පෝෂණයක් නොලැබෙන නිසා දරුවන් ඉපදෙන්නෙම අඩු බරකින් යුතුවයි.

දරුවාට අවශ්‍ය ආහාර නොලැබීම නිසා, දිනපතාම දරුවන් පාසලේදී කලන්තේ දැමීම, පාසලට නොපැමිණීම වැනි කතා සුලභව අසන්නට ලැබෙනවා. මේ අතර මිරිස් කුඩු ඉසින ලද බත් දරුවන් පාසලට රැගෙන ඒම, පාසැලේ බුද්ධ පූජාව ආහාරයට ගැනීම වැනි හිතට කාවදින දුක්බර කතාද අපට ඇසෙන්නට ලැබෙනවා.

ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ බිත්තරයක් රුපියල් 17/-ක්. අද වෙනකොට බිත්තරයක් රුපියල් 54/-, 56/-කට විකිණෙනව.

දැන් අම්මාට තීරණය කරන්න වෙලා තියෙන්නේ ගෙදර ඉන්න මොන දරුවාටද බිත්තරය දෙන්නෙ කියලා. හොරකම සහ වංචාව, ප්‍රමුඛ කර ගත් පාලකයන්ගේ ක්‍රියා හේතුවෙන් අපේ දරුවො බඩගින්නේ තියන්න අපට සිද්ධවෙලා තියෙනවා. මෙන්න මේ දේශපාලනය තේරුම් ගන්න වගේම මෙයට එරෙහිව නැගී සිටින්නත් කාන්තාවො හැටියට අපට ලොකු වගකීමක් තියෙනවා.

## යල්පැන ගිය ඉරානය

ඉරානයේ නීතිය අනුව කාන්තාවන් හිජාබයක් හෝ ස්කාෆයක් පැළඳීම සහ සංවරශීලී යැයි සැලකෙන ඇඳුම් ඇඳීමද අනිවාර්ය වේ. මෙම වාරණය උල්ලංඝනය කර ඇඳුම් ඇඳීම සම්බන්ධව චෝදනා ලබා පොලිස් සිරභාරයට පත්කරන ලද 22 හැවිරිදි තරුණියක් පොලිස් භාරයේ සිටියදී මිය යාමත් සමග එරට ඉස්ලාම් සදාචාර නීති පද්ධතියට එරෙහිව විරෝධතා පැන නැගී ඇත. මාෂා අමානි නැමති මෙම තරුණියගේ අවසන් කටයුතු සඳහා සිය ගණනක් සහභාගී වූහ. ඇය ටෙහෙරාන්හිදී අත්අඩංගුවට ගෙන ඇත්තේ නියමිත ආකාරයට හිස ආවරණය පැළඳ නොසිටීම යන චෝදනාව මතයි. පසුව හෘදයාබාධයක් හේතුවෙන් රෝහල් ගතකිරීමෙන් අනතුරුව මරණයට පත්වූවාය. මෙම මරණය හේතුවෙන් ස්ක්වෙස් නගරයේ විරෝධතාවලදී එරට ආධ්‍යාත්මික නායක අයතුල්ලා අල් කමේනිගේ පොස්ටර් ඉරා දැමෙන ආකාරයද දක්නට ලැබුණි. මෙම විරෝධතා විසිරුවා හැරීමට පොලිසිය විසින් කඳුළු ගෑස් යොදා ගන්නා ලද අතර පොලිසිය සහ විරෝධතාකරුවන් අතර ගැටුම්වලදී දෙපාර්ශවයටම සුළු තුවාල ඇති විය. මෙම විරෝධතා හේතුවෙන් සැප්තැම්බර් 16, 17 යන දෙදින තුළදී ඉරානයෙහි කොටසක අන්තර්ජාලය වාරණය කිරීමටද එරට රජය කටයුතු කරන ලදී. මෙම සිදුවීමත් සමග ඉරානයේ ජනප්‍රිය පුද්ගලයින්, ක්‍රීඩකයෝ සහ දේශපාලනඥයෝ සදාචාර පොලිසිය අවලංගු කළ යුතු බවට මත පළකරමින් සිටිති.

## නව ගබ්සා නීතිවලට හංගේරියානු කාන්තා අප්‍රසාදය

සැප්තැම්බර් මස 14 වන දා හංගේරියාවේ ගබ්සාව සම්බන්ධ නීතිවලට සංශෝධනයක් සිදුකරන ලද අතර ඒ සම්බන්ධයෙන් එරට කාන්තාවන් අප්‍රසාදය පළකරන්නේ එය ගබ්සාවක් සිදුකරීමට ඇති ඉඩකඩ ඇහිරීමට ගත් පියවරක් බව පෙන්වා දෙමිනි. මෙකී නව සංශෝධනයට අනුව ගබ්සාවක් සඳහා ඉල්ලුම් කිරීමට පළමුව කාන්තාවක් ඇයගේ කුස තුළ හෘද ස්පන්ධනය සහිත සජීවී කලලයක් ඇති බව ඔප්පු කරන වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. මෙයට විරෝධය පළකරන එරට කාන්තාවන් ප්‍රකාශ කරන්නේ මෙය විසින් ගබ්සාවක් හේතුවෙන් පීඩාවට පත්වන කාන්තාවක් වඩා වැඩි මානසික පීඩාවකට සහ කඩාවැටීමකට භාජනය වන බවයි. හංගේරියාවේ වර්තමාන නීති අනුව ස්ත්‍රී දූෂණයක්, දැඩි ලෙස ආබාධිත දරු පිළිසිඳ ගැනීමක්, මවගේ ජීවිතයට හානිදායක දරු පිළිසිඳ ගැනීමක් යන අවස්ථාවලදී ගබ්සාවක් වෙත යොමුවිය හැකිය. කෙසේ නමුත් මෙම නව නීතිය හේතුවෙන් ගබ්සාවක් සිදුකිරීමට සිදුවන කාන්තාවකට වඩා වැඩි මානසික කම්පනයකට මුහුණ දීමට සිදුවනු ඇත.

## සියල්ලටම පෙර උරුමයි

**සිහින අපි හැමදාම දැක්කා
ඒත් තව ඉටු නොවුනෙ මක්කා?
අපි දැකපු හීන උන්
සීත කාමර ඇතුළෙ වික්කා**

**හොඳම දේවල් අපිට දෙනවා
ආණ්ඩුවෙ උන් ලොකු පොතක
ලියලා තිබුණා
කොහෙද ඉස්කෝලෙක
දවල් කෑමට කලටි පොල්
ගෙනැත් තිබුණා**

**එංගලන්තේ රැජිණගෙ
මළ ගෙදරටත් යනවලු
පිච්චුන ගෙවල් වෙනුවෙන්
වැඩියෙන් වන්දි දෙනවලු
ඉස්කෝලෙ උදේ රැස්වීමෙදි
ළමයි මහ ගොඩ දෙනෙක්
ක්ලාන්තව බිම වැටුණා
පහුගිය වතාවෙදි
උන්ගෙ මහ උන්
රට බේරගන්න ඡන්දෙත් දුන්නා**

**පෙරදිග ධාන්‍යාගාරෙට
ගිනි තිබ්බ හනුමා
අපිට බත්පත වරදා
හොඳටම කළේ එතුමා
හැත්තෑ සිව් වසරක්
උන්ට කඹුරපු හින්දා
පැරකුම් රජාණොත්
දැන් විරසකද මන්දා**

**අපේ ලෝකයේ හීනය
අකාලයෙ මිලින වනු ඇත
උන් දෙන හීන බල බල
අපි බඩසයින් මියෙමුද?
අපිට වැරදුනෙ කොතැනද
විමසා බලනු මිස
තවත් මොන හීනද
ඉතින් නින්දෙන් මිදෙමු
විගසින...!**

# ආසියාතික පසුගාමීත්වය හා ප්‍රභූ වන්දනාව

ප සුගිය දිනවල අපේ රටේ සාකච්ඡාවට ගත යුතු සිදුවීම් දෙකක් වාර්තා විය. එකක් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහ රැජිනගේ අවමංගල උත්සවයට සහභාගි වීමට එංගලන්තය බලා යාමය. අනෙක අලුත විවෘත කළ නෙළුම් කුලුනට මුදල් ගෙවා උඩටගොස් බිමට බැස සමහරු කියූ කථාය. එක් හිමි නමක් ප්‍රකාශ කළේ උඩට ගිය විට තව්තිසා දෙව්ලොවට ආසන්න වූ බවක් දැනෙන බවය. සමහර කාන්තාවෝ මේ සිදු කළ පුණ්‍යකර්මයට මහින්ද රාජපක්ෂට පින් දුන්නෝය. මෙම සිදුවීම ඉතාම සරල වුවත් මින් හෙළි වන ජනතාවගේ මනෝභාවය කිසියම් සමාජ අධ්‍යයනයකට ප්‍රස්තුත කර ගත හැකිය.

### යටත්විජිත ගැති බව

ලංකාව තුළ රනිල් වික්‍රමසිංහ ස්ථාන ගත කර තිබුණේ ලිබරල්වාදියෙක් ලෙසය. ඒ අතරම ලංකාවට එංගලන්තයෙන් ඊනියා නිදහස දිනාදුන් (?) බව කියන ඩී.එස්. සේනානායකගේ පක්ෂයේ එනම් එජාපයේ වත්මන් නායකයාද රනිල්ය. එහෙත් දැන් එම රනිල් වික්‍රමසිංහම රටේ විදේශ වත්කම්ද බිඳවැටී තිබියෙදී තකහනියේ එංගලන්ත මහ රැජිනගේ අවමඟුලට යාම අප තේරුම් ගත යුත්තේ කෙසේද? එය ආසියාතික පසුගාමී මානසිකත්වයේ හා ප්‍රභූ වන්දනාවට ඇති කැමැත්තේ පිළිබිඹුවකි.

ලබාගත් නිදහසක් පිළිබඳ පම්පෝරි ගැසුවද ඇත්තටම රනිල් වික්‍රමසිංහලා නියෝජනය කරන ප්‍රභූ පැලැන්තිය එංගලන්ත රැජිනගෙන් වරප්‍රසාද ලබා ගත්, යටත්විජිත ගැති මනසක් සහිත පිරිසකි. ඒ නිසා නිදහසින් වසර 74කට පසුත් එම යටත්විජිත ගැති මානසිකත්වයෙන් ගැලවීමට රනිල් වික්‍රමසිංහලාට නොහැකි වී ඇත. බ්‍රිතාන්‍ය ආණ්ඩුව රැජිනගේ අවමඟුල් දිනය රජයේ නිවාඩු දිනයක් බවට ප්‍රකාශ නොකර තිබියෙදී එදින ලංකාවේ නිවාඩු දිනයක් කරගන්නේද එම ගැතිකම පෙන්වීම සඳහාමය.

එංගලන්ත රජ පවුල යනු බ්‍රිතාන්‍ය වැඩවසම් ක්‍රමයේ මෙන්ම යටත්විජිත ක්‍රමයේද අවසන් නොකළ නෂ්ටාවශේෂයන්ගෙන් එකකි. එය තවදුරටත් නූතන සභ්‍ය සමාජයට නොගැලපේ. එහෙත් ලාංකේය ජනයා තවදුරටත් යටත්විජිත ගැති, රැජිනට ගරුකරන මනෝභාවයක තබා ගැනීමට රනිල් වික්‍රමසිංලාට අවශ්‍ය වී තිබේ.



### කැප්පෙටිපොළ හා රැජින

මෙහි බරපතළම ප්‍රතිවිරෝධය වන්නේ සැම පෙබරවාරි 04කම නිදහස සමරන පාලකයින් ඒ අතරම මහ රැජිනටද වන්දනාමාන කිරීමය. ඒ දෙක පරස්පර විරෝධීය. එහෙත් මොවුහු ඒ දෙකම සිදුකරති. එපමණක් නොව අපේ රටේ කැප්පෙටිපොළ, පුරන්අප්පු සලකන්නේ ජාතික වීරයන් ලෙසය. කැප්පෙටිපොළ, පුරන්අප්පු කැරලි ගැසුවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයට එරෙහිවය. ඒ නිසාම යටත්විජිත පාලකයෝ ඔවුන් මරා දැමූහ; වැව් අමුණු විනාශ කළහ; ගොවිබිම් ගිනිබත් කළහ. දැන් මියගිය රැජිනට ගරුබුහුමන් දැක්වීමට රනිල් යන්නේ මේ ඉතිහාසය මෙසේම තිබියෙදීය. මෙරට පාලකයන්ගේ දෙබිඩි බව තේරුම් ගැනීමට මෙය හොඳම නිදසුනක් වේ.

රටේ ජනතාව රවටා බලය ලබාගැනීමේදී පාලකයින්ට කැප්පෙටිපොළලා පුරන්අප්පුලා උත්කර්ෂයට නැංවිය යුතුය. ඒ ජනතාව රැවටීමටය. එහෙත් ඔවුන්ගේ ඇත්ත බැඳීම ඇත්තේ යටත්විජිත පාලකයන් සමගය. ඒ, තමන්ට බලය ලබාදුන් ඇත්ත ස්වාමීන් යටත්විජිත පාලකයන් වූ නිසාය. එකී වහල් මානසිකත්වයෙන් මිදීමට 'ලිබරල්වාදී' රනිල්ටද නොහැකිවී ඇත.

### නෙළුම් කුලුන හා තව්තිසාව

ලංකාවේ දැන් පෙන්වන නෙළුම් කුලුනේ කථාව කුමක්ද? රටකට මෙවැනි ඉදිකිරීම් තිබුණාට කමක් නැත. ජනතාව එවැනි දේ තුළින් සතුටක් ලැබීමද හොඳය. ඒ, එම ඉදිකිරීම කර ඇත්තේ රටේ මුදලින්, රටේ ශක්තියෙන් නම්ය. නෙළුම් කුලුන යනු විදේශවලින් ණය රැගෙන ණයට ඉදිකළ එකකි. දැන් මුළු රටම විඳවන ණය අර්බුදය තුළ කුලුනේ ණයද තිබේ. මේ සඳහා චීනයෙන් ඩොලර් මිලියන 88.6ක ණයක් ගත් බව පැවසේ. මෙහි මුළු වියදම ඩොලර් මිලියන 104.3කි. චීන ණයට අමතර ඉතිරි මුදල දැරුවේ විදුලි සංදේශ නියාමන අධිකාරියය.

ණයට හැදූ, ණය ගෙවීමට කිසිම හැකියාවක් නැති, කුලුනට නැග තව්තිසාව ගැන කියන අය, මහින්ද රාජපක්ෂට පිං දෙන අය රටේ වර්තමාන විපතට කුලුනේ ණයද හේතුවක් බව නොදන්නවා විය හැක. කෙසේ වෙතත් මෙම තව්තිසා දෙව්ලොව දැකීමේ කථාව තුළත්, මහින්දට පිං දෙන කථා තුළත් ඇත්තේ නොදන්නාකම පමණක් නොවේ. ආසියාතික පසුගාමී මනෝභාවය මෙන්ම ප්‍රභූන්ට වන්දනාමාන කිරීමේ පරාධීන මානසිකත්වයද තිබේ.

### රජෙක් සෙවූ රටක්

පසුගිය මාස කිහිපය තුළ රටේ ඇතිවූ බරපතළ සමාජ ආර්ථික ගැටලු නිසා විශාල රාජපක්ෂ විරෝධයක් රට තුළ නිර්මාණය වුවද ඊට පෙර කලක් මෙරට ජනයා රාජපක්ෂවරුන් සැලකුවේ රජ පවුලක් ලෙසය. පසුගිය 2019 මැතිවරණ සමයේ රාජපක්ෂවරුන්ට තම බිරිඳ වුව දීමට කැමති බව ප්‍රසිද්ධියේ පැවසූ අයද, රාජපක්ෂවරුන්ගේ මුහුණු තම සිරුරේ පච්චා කොටාගත් අයද, දැක ගත හැකි විය. ඒ සියල්ලෙන් පෙන්වන්නේ ජනතාවගෙන් සමහර අය තුළ තවමත් පවතින ගැති බව හා ප්‍රභූ වන්දනාවට ඇති කැමැත්තය.

ප්‍රභූ වන්දනාවට ඇති කැමැත්ත බොහෝ දෙනෙක්ගේ යටි සිතේ තිබේ. අවස්ථාවක් ලද විගස එය මතුවේ. නෙළුම් කුලුන පෙන්වූ විට යළි මතුවූයේද එම තත්වයය. රනිල් වික්‍රමසිංහ එංගලන්ත රජ පවුලට ගැතිවන්නාසේම ලංකාවේ ඇතැම් ජනයාද මෙරට ප්‍රභූ පවුල්වලට ගැති බව දක්වයි. රාජපක්ෂ පවුල කලක් මෙරට ජනයා සැලකුවේ රජ පවුලක් ලෙසය. ඔවුන් කරන හොරකම්, මැරකම් හා රටට කළ ආර්ථික දේශපාලන විනාශයන් දැක දැකත් ඉන් පීඩාවට පත්ව සිටියදීත් රජ පවුලේ ගුණ වැයීමට අවස්ථාව ලද විට ඉදිරිපත් වන සමහරුන් තුළත් අප දකින්නේ මෙම ප්‍රභූ වන්දනාව සඳහා ඇති බැඳීමය; යටත් වීමට ඇති මානසික කැමැත්තය; ගැතිවීමේ මනෝභාවයය.

> රට දැන් වැටී තිබෙන අගාධයෙන් ගොඩගැනීමට නම් ආර්ථික සංවර්ධනයේ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති පමණක් නොව නිදහස් පුරවැසියෙක්ද අවශ්‍ය වේ. සැබෑ ලෙසම ගත්විට වර්තමාන විපතෙන් රට මුදා ගැනීමට නම් පළමුවෙන් මෙරට ජනයා චින්තන වහලුන්ගේ සිට, යටත්වැසියන්ගේ සිට නිදහස් පුරවැසියන් බවට පත්විය යුතුය.

### නිදහස් පුරවැසියෙක් තැනීම

මේ රට දැන් වැටී තිබෙන අගාධයෙන් ගොඩගැනීමට නම් ආර්ථික සංවර්ධනයේ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති පමණක් නොව නිදහස් පුරවැසියෙක්ද අවශ්‍ය වේ. සැබෑ ලෙසම ගත්විට වර්තමාන විපතෙන් රට මුදා ගැනීමට නම් පළමුවෙන් මෙරට ජනයා චින්තන වහලුන්ගේ සිට, යටත්වැසියන්ගේ සිට නිදහස් පුරවැසියන් බවට පත්විය යුතුය. මේ වන විට ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් තුළ මෙමෙ වෙනස සිදුවී තිබීම සාධනීය ලක්ෂණයකි. එහෙත් යටත්වැසියන් ලෙස සිතන, පුරවැසියන් බවට පත්විය යුතු තවත් විශාල ප්‍රමාණයක් රට තුළ සිටින බවද පෙනේ. ඔවුන් පාලකයින්ට පහසුවෙන් රවට්ටා ගත හැකි වන අතර ඔවුන්ද රැවටෙන සුළුය.

මෙම සමාජ මනෝභාවය අනාගත නව සමාජයක් ගොඩනැගීමේදී අභියෝගයක්ව පවතී. එම අභියෝගය ජයගත යුතුය. ලංකාවේ ජනතාව ඓතිහාසිකව ආසියාතික රාජාණ්ඩු සමයේ සිට ඉන්පසු යටත්විජිත පාලනයේ සිට පරපුරෙන් පරපුරට රැගෙන ආ මෙම පරාධීන මනෝභාවයේ, යටත්වැසිභාවයේ 'බර පොදිය' දැන්වත් ඉවත දැමිය යුතුය. එලෙස ඉවත දමා 'නිදහස්' වීමට ඔවුනට මඟ පෙන්විය යුතුය. මෙරට සැබෑ ප්‍රගතිශීලී බලවේගවල අත්හළ නොහැකි වගකීම වන්නේ ජනතාව මෙම පරාධීන මානසිකත්වයෙන් හැකි ඉක්මනින් මුදා ගෙන ඔවුන් නිදහස් පුරවැසියන් බවට පත්කිරීමය. නව දියුණු සමාජයක් ගොඩනැගීමේ එක් පූර්ව කොන්දේසියක් වන්නේ එයයි.



"වැරදීම් ඒවා සිදුවන මොහොතේදී වේදනාකාරීය. එහෙත් වසර ගණනාවකට පසු එම වැරදීම්වල එකතුවට අත්දැකීම් යයි කියනු ලබන අතර ඒවා සාර්ථකත්වයට මඟපෙන්වනු ලබයි."

**අබ්දුල් කලාම්**

# පොලිට්කල් පංතිය

පොලිටික්ක උදේම පංතියට ඇතුල් වෙනකොටත් හිටියෙ අඩ නින්දෙද මන්ද වසන්තියයි අනුරුද්දියයි ගුඩ් මෝනිං කියනව ඇහුණෙ නෑ. පොලිටික්ක උත්තර නොදීපු හින්ද කෙල්ලො දෙන්නට ඇවිත් හිටපු කොල්ලො පල් එක දැම්ම.

"පැනල දෙන්න හැදුවට ගත්තෙ නෑ...නේ..." කවුද කිවුවෙ කියල හරියටම පෙනුණෙ නෑ.

"අපි මොනවත් දෙන්න ගියේ නෑ..." අනුරුද්දිය පිටිපස්සට හැරිල කිවුවෙ වසන්තිය රවලා බලන අතරෙ.

"ළමයිනේ තාම කට්ටිය ඇවිත් නෑ නේද?" පොලිටික්ක උත්තරයක් එන්නත් කලින් මේසෙට ඔළුව තියා ගත්තා.

"සර් හොඳටම නිදිමතේ" වසන්තිය කිවුවෙ ඇහෙන නෑහෙන ගාණට.

"මම නං හිතන්නෙ එකත් එකටම සර් මළගෙදර ගිහින්. නිදිමරල ඇවිත් තියෙන්නෙ" මංජුව අසුරක් ගහල ටක්කෙටම කිවුව.

"ඇයි ඔයා දැක්කද සර් මළගෙදරක යනව" අනුරුද්දිය හෙමින් ඇහුවෙ තමන්ට ඒක දැනගන්න බැරිවුණ එක අපරාධයක් වගේ... "කාගෙද මළගේ... සර්ගෙ නෑයෙක්ගෙද?"

"නෑ මම දැක්කෙ නෑ. ඒත් මළ ගෙදරම තමයි.... සර්ගෙ නෑයොද කියන්න දන්නෙ නෑ. එත් සර්ලගෙ කට්ටිය නෑකම් කියන්න හදන බවනම් දන්නව" මංජුවගෙ හතර බීරි කතාවට පංතියම අන්දුන් කුන්දුන්.

"අයියෝ මංජු..." "වටේ යන්නෙ නැතුව හරියට කියන්නකො" "කාගෙද මළගේ" "ඔයා කොහෙමද දන්නෙ" පංතියෙ හතර වටෙන් ප්‍රශ්න එද්දි මංජුව කටට කෙලින් ඇඟිල්ල තිබ්බෙ කෑ ගහන්න එපා කියන්න.

"මළගේ එලිසබත්ගෙ" මංජුව ළඟ නැමුව.

"මොන එලිසබත්ගෙද?... කවුද එලිසබත් කියන්නෙ" කීපදෙනෙක්ට හිනා ගියත් වසන්තිය කලබලේ එයා නොදන්න එලිසබෙත් ගැන ඇහුව.

"ඇයි කට්ටිය ගියේ... මං කිවුවෙ ක්වීන් එලිසබත් ගැන... නිවාඩුත් දීල තිබුණානෙ... සර් ගිහින් නයිටක් ඇද්දද දන්නෙ නෑ" මංජුව ඇඟට නොදැනි කියල දාලා මුළු පංතියටම හිනා පනිද්දි පොලිටික්ක ගැස්සිලා ඇහැරුණා.

"මොකද්ද ළමයිනේ ගෝසාව... සෝමාලියාවට පාන් දැම්ම වගේ" පොලිටික්ක ඔළුව ඉස්සුවෙ කවුරුවත් නිදාගෙන හිටියෙ නෑ වගේ.

"දැන්නම් සර් සෝමාලියාවට නෙමෙයි... මෙහෙ පාන් බෙදනව කිවුවත් ලොකු වෙනසක් වෙන එකක් නෑ" සමන කිවුව.

"ඒක නෙමෙයි සර්... මොකද නිදිමතේ වගේ හිටියෙ... මළ ගෙදරකවත් ගියාද?" කනිය පංතියෙ වෙච්ච කතාව සාරාංශ කළා.

"ඔව්නෙ... ඔය ළමයි දන්නෙ කොහොමද? එකක්නම් බැරියෑ... මළ ගෙවල් දෙකක යන්න වුණා" පොලිටික්ක කිවුවෙ ඇස් පොඩි කරන ගමන්.

"ෂින්සො අබේගෙ මළ ගෙදර මට අමතක වුණානෙ" මංජුව කියලා කට ගන්න වුණේ නෑ පංතියෙ ආපහු හිනා පැන්න.

"මොකද හිනා වෙන්නෙ? මෙතන මොකද්ද හිනා වෙන්න තියෙන්නෙ? කවුද අබේ...?" පොලිටික්කට මල.

"නෑ සර්. සර් නිදි අතරෙ අපි කතා වුණේ අපේ රටේ නායකයින්ගෙ මළ ගෙවල්වල යාම. එංගලන්තෙත් නැති නිවාඩු දීගෙන අපේ ගැතිකම පෙන්නන්න හදනවා. රැජිනගෙ මළ ගෙදරට නිවාඩු දීපු එකට ඇදුණෙ නැත්නම් ෂින්සො අබේගෙ මළ ගෙදරටත් නිවාඩු දෙන්න හිටියෙ... මේවා තමයි මේ පාලකයින්ගෙ රාජ්‍යතාන්ත්‍රික වැඩ. අපි ඔයාලට හෙණ ගැතියි කියල පෙන්නන්න හදනව. එයාලා හිතන්නෙ එතකොට එංගලන්තෙ ෂේප් කරගන්න පුළුවන් කියලා. මානව හිමිකම් කොමිසමේදි පොදු රාජ්‍ය මණ්ඩලේ රටවල ඡන්ද ගන්න පුළුවන් කියල. ජපානෙන් ණයට මොනව හරි ඉල්ල ගන්න පුළුවන් වෙයි කියල. වැඩක් පලක් නැති වුන් කෑම වේලකට දෙකකට මළ ගෙවල් හොය හොය රස්තියාදු ගහනව වගේම තමයි..." සමනගෙ කතාවෙ අන්තිම හරියෙදි පොලිටික්කගෙ මූණ රතු වුණා.

"මට නං යන්න වුණේ වයිෆ්ගෙ පැත්තෙ මළ ගෙවල් දෙකකට... නොගිහින් බැරිකමට. දුර හින්ද එන්න බැරිකමට රෑ ඉන්න වුණා... හරි හමන් නින්දක් නෑ..." පොලිටික්ක තමන් එංගලන්තෙයි ජපානෙයි ගියේ නැති බව ඔප්පු කරනව...





# බෑනාගේ වික්‍රමය...

"සර්පයෙක් කටු ඉපල්මිටියක් මතට වී ගඟක පාවී ආවේය. අසළ සිටි හිවලෙක් ඒ දැක නැවටම ගැලපෙන කප්පිත්තෙකැයි සරදමක් කළේය" (ඊසොප්ගේ උපමා කථාවකි.)

කිසියම් තක්කඩිකමක් කරන්නට බට, දුෂ්ට පුද්ගලයෙකු සම්බන්ධයෙන් මේ උපමා කතාව ගලප්පා ගන්නා ලෙස ඊසොප්ම අපට කියයි.

දැන් දේශපාලනික නන්නත්තාරවී ගසාගෙන යන රාජපක්ෂ කටු ඉපල මත ලැග සිටින සර්පයා රනිල්ය. දැන් ඔහු රටේ පැන නගින හැම ජනතා අරගලයකටම දෂ්ට කිරීමට පටන්ගෙන ඇත. රටේ සකලවිධ අසාධාරණකම්වලට එරෙහිව නැගී සිටි තරුණ තරුණියන් දසදහස් ගණනක් වධදී මරා දැමූ රනිල්ලා රටේ ප්‍රශ්නවලට උත්තර හොයන එකම විධි ක්‍රමයද එයයි. ඔවුන් දන්නා භාෂාවද එයයි. රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ මර්දනයට එරෙහිව පසුගියදා වීදි බට සමාජවාදී තරුණ සංගමයේ සහෝදර සහෝදරියන්ට රනිල්ලා උත්තර දුන් භාෂාවද එයයි. රාජපක්ෂ කටු ඉපල මත ලැගගෙන ගසාගෙන යමින් සිටින රනිල් නම් සර්පයා කටු ඉපල සමගම තමන්ටද අත්වන ඉරණම නොදැන උමතු දේශපාලන රංගනයක යෙදී සිටී. තම වැසිකිළියේ සිට මන්දිර දක්වාම අධි ආරක්ෂක කලාප බවට පත්කරගෙන සදාකාලිකව බලයේ සිටීමට සිහින දකින මේ දුෂ්ට මහල්ලන්ගේ සිහින කුඩුපට්ටම් වී ඔවුන්ගේ දේශපාලනය සමගම සුණු විසුණු වී යාම වැඩි ඈතක නොවනු ඇත.

# "ලෝකෙට ලොක්කා මං තමයි ගම දුනියාවේ. මේ වගෙ ලොකුකම් කවුරු කරාවිද ලංකාවේ"...



බොරු පම්පෝරි ගසන ක්‍රීඩකයෙකු කලක් යද්දී ඔහුගේ පූචානම් කතා හෙළිවී රටවැසියන්ගේ සමච්චලයට ලක්විය. වැඩබැරි, හඬ පමණක් ඇති මේ ක්‍රීඩකයා රට හැර දමා විදෙස්ගත විය. කලකට පසු නැවත සිය රටට පැමිණි ඔහු බොහෝ නගරවල ක්‍රීඩා තරගවලදී තමා ජය පිට ජය ලැබූ බවත් විශේෂයෙන් රෝඩ්ස් නම් දූපතේදී තමන් කිසිදු ක්‍රීඩකයෙකුට සමකළ නොහැකි වන පරිදි මහා පිම්මක් පැන්න බවත් කියමින් මහා පුරසාරමක් කියා පෑවේය. ඒ වගේම එහි සිටි ජනයා කවදා හෝ තම රටට පැමිණියහොත් ඊට සාක්ෂි දරනු ඇතැයිද ඔහු කීවේය. ඔහුගේ කතාව අසා සිටි මිනිසෙක් ඔහුට මෙසේ අභියෝග කළේය. "යාළුවා ඔබ කියන දේ ඇත්ත නම් සාක්ෂි මොකටද?...මෙතන තමයි රෝඩ්ස් කියලා හිතපන්. දැන් පැනල පෙන්නපන්" යයි කීවේය. (ඊසොප්ගේ උපමා කතාවකි)

මේ කථාව අපට සිහිවූයේ පසුගියදා පොහොට්ටුවේ එක්තරා දේශපාළුවෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ආසියා කුසලාන ජයග්‍රහණය කිරීමෙන් පසුව කළ පම්පෝරි කතාවක් නිසාය. තම ස්වාමියා සනසාලනු වස් කී එම කතාවෙන් ඔහු පවසා සිටියේ, ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ආසියානු කුසලානය දිනාගැනීමට සමත් වූයේ නාමල් රාජපක්ෂ ක්‍රීඩා ඇමති කාලයේ හදපු සැලසුම් නිසා බවයි. ඒ වගේම ඔහු ක්‍රීඩා ඇමතිකමට වඩාත් සුදුස්සා බවයි. ඉන්පසු නාමල් රාජපක්ෂද ප්‍රකාශයක් කරමින් කියා සිටියේ තමන් ක්‍රීඩාව දියුණු කිරීමට ගත් පියවර තමන්ගේ ප්‍රතිරූපය ගොඩනැංවීමට ගත් ඒවා නොවන බවත් තමන් ඒවා ගත්තේ ක්‍රීඩාවේ සහ රටේ පොදු යහපත වෙනුවෙන් බවත් එවැනි වැඩවලින් සද්දෙ දමා පුද්ගලිකව ලකුණු දමා ගැනීම තම ප්‍රතිපත්තිය නොවන බවත්ය.

නාමල්ලා රට වෙනුවෙන් කරපු හරිය මුළු රටම දනී. ඒ කතාව මඳකට පැත්තක තියා අර කතා කියන දේශපාළුවාටත් නාමල්ටත් මෙසේ කියමු. මෙතන රෝඩ්ස් මෙතන වැඩ දමා පෙන්වන්න. නැත්නම් අනුන්ගේ වැඩවලින් ලකුණු ගැනීමට ගොස් තව තවත් නාගන්නේ නැතිව මුඛය හා අධෝ මුඛය පූට්ටු කරගෙන ඔය සුවනින්දේ තව ටික කලකට සැතපෙන්න.

# ජන විරෝධී පාලකයා නිතරම සොයන්නේ අධි ආරක්ෂාවය...




පසුගියදා රනිල් රාජ්‍ය ඇමති මණ්ඩලයක් පත් කළේය. ගණනින් එය 38ක් පමණ වේ. තවත් 12දෙනෙකුට ඇමති පත්වීම් දීමට නියමිත බවද වාර්තා වී ඇත. මේ පත්කළ ඇමති මණ්ඩලයේ ඉන්නේද රාජපක්ෂලා වටා සිටි පරණ හොරු ටිකමය.

සමහර ලිබරල් මහත්වරු හිතා හිටියේ මේ නවලිබරල් මහත්මයා වඩා විද්‍යානුකූල, තර්කානුකූල තරමක හෝ යහගුණය සහිත ඇමති මණ්ඩලයක් පත්කරාවිය කියාය. එසේ පත්කරනවා නම් පාර්ලිමේන්තුවෙන් පිටත මිස එහි ඇතුළතින් එවැනි යහගුණ පිරි මිනිසුන් දහ දොළොස් දෙනෙකුට වඩා සොයාගත නොහැකි බව රටේ බහුතර ජනයා නම් දැන සිටි බවට සැකයක් නැත. රනිල් දැන් මේ චෞර ඇමති මණ්ඩලයත් පිරිවරාගෙන නැවත වරක් විපක්ෂයේ කණ්ඩායම්වලට සර්වපාක්ෂික අටමගලයකට ඇරයුම් කරමින් සිටී. අනික් අතට රනිල් යනුම, මහා බැංකු හොරකමේ ප්‍රධාන වගකිවයුත්තා බවට රටෙන්ම චෝදනාවලට ලක්වූ පුද්ගලයෙකු බවද නොරහසකි. එනිසා රටේ ඉතුරු ටිකත් විකුණාගෙන කා හොරකම් කිරීම හැර අන් විකල්පයක් මේ නවලිබරල් පල්හොරුන්ට නැත. දිගින් දිගටම මර්දන නීතිගෙන එමින් රටේ මතුවන විරෝධතා මැඩලීමට ගන්නා පියවරයන්ගෙන්ම එය හොඳින්ම පැහැදිලි වේ.

හොරු නිතරම රැකවරණ ලැබීමට තෝරා ගන්නේ ආරක්ෂිත කලාපයයි. ඔවුහු වැඩි වැඩියෙන් අධිආරක්ෂක කලාප සොයමින් දුවති. ඒ තමාත් තමා සොරාගත් දේපොළත් ඒවායේ ඇත්ත අයිතිකරුවන්ගෙන් රැක ගැනීම සඳහාය. එහෙත් ජනතා දේපොළ හාරා කෑ පාලකයින්ට විරුද්ධව බුර බුරා නැගෙන ජනතා චණ්ඩ මාරුතයෙන් බේරීමට අහසේ හෝ පොළොවේ හෝ ගල් ගුහාවක හෝ මහ මුහුදේ හෝ කිසිදු තැනක් අධි ආරක්ෂිත කලාපයක් නොවෙනු ඇත.

# බහුජාතික සමාගම් කිහිපයකට ...

05 පිටුවෙන්



අපි විකුණා දැමිය යුතුද? මේ අකාර්යක්ෂමතාවය තිබෙන්නේ ආයතන රජය සතුද, පෞද්ගලික අංශයේද යන්න මත නොමෙයි. මෙතන තිබෙන්නේ සමාජ ආර්ථික ගැටලුවක්. අප විසඳිය යුත්තේ එයයි.

රාජ්‍ය ආයතන විශාල පාඩුවක් ලබනවා, ඒවා භාණ්ඩාගාරයට විශාල බරක් බවට තවත් යෝජනාවක් එනවා. ඒ නිසා මේ ආයතන විකුණා දැමිය යුතුයි යන මතයක් ගොඩනඟනවා. මේ වන විට මහ බැංකුවත් පාඩුයි. කැබිනට් මණ්ඩලයත් පාඩුයි. පාඩු ලබන ආයතන විකුණා දැමිය යුතු නම් මේ ආයතනත් විකුණා දැමිය යුතුයි. නමුත් මේ විකුණා දමන්න සූදානම් වන්නේ පාඩු ලබන ආයතන පමණද? මේ වන විට ලාභ ලබමින් තිබෙන ටෙලිකොම් ආයතනයේ ආණ්ඩුව සතුව 51%ක් තිබෙනවා. දැන් මේ 51% විකුණන්න යෝජනා කරනවා. ඊට අමතරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විකිණීමට යෝජනා වෙලා තිබෙනවා. 2003 සිට 2021 දක්වා සෑම වසරකම ආණ්ඩුවට බදු ගෙවා තිබෙනවා. ඒ වගේම කොටස් හිමියන්ට ලාභාංශ ගෙවා තිබෙනවා. 2021 වසරේ එය මිලියන 1700ක බදු ආණ්ඩුවට ගෙවා තිබෙනවා. ලාභාංශ ලෙස 1500ක් ගෙවා තිබෙනවා. මේ අනුව බදු හා ලාභාංශ ලෙස මිලියන 3200ක් භාණ්ඩාගාරයට ලැබී තිබෙනවා. එසේනම් මේ ලාභ ලබන ආයතන විකුණන්නේ ඇයි?

එයාර් ලංකා සමාගම සතුව එයාර් ලයින්, ග්‍රවුන්ඩ් හැන්ඩ්ලින්, කේටරින් සේවාව යනුවෙන් ආයතන තුනක් තිබෙනවා. නිමල් සිරිපාල පසුගිය දිනවල කියා සිටියේ කේටරින් සේවාව විකිණිය යුතු බවයි. 2011 සිට 2021 දක්වා වසර 11ක ගිණුම් වාර්තාවලට අනුව 2020 හා 2021 හැරුණු විට අනිකුත් සෑම වර්ෂයකම කේටරින් ලාභ ලබා තිබෙනවා. (2020-2021 වසරවලට කොවිඩ් තත්වය බලපා තිබෙනවා) එය 2021 - 2022 වර්ෂයේ මිලියන 2796ක් ලාභ ලබා තිබෙනවා. 2019 - 2020 වසරේ මිලියන 4760ක් ලාභ ලබා තිබෙනවා. පාඩු ආයතන විකුණන්නේ නම් ලාභ ලබන කේටරින් විකිණිය යුතු වන්නේ ඇයි? ග්‍රවුන්ඩ් හැන්ඩ්ලින් 2021 වසරේ මිලියන 5009ක් ලාභයි. එසේ නම් ලාභ ලබන ග්‍රවුන්ඩ් හැන්ඩ්ලින් විකුණන්නේ ඇයි? එයාර් ලයින් එක පාඩුයි. මේ පාඩුව සිදුවන්නේ කෙසේද? ජාත්‍යන්තර බැඳුම්කර ලෙස ඩොලර් මිලියන 175ක ණයක් අරගෙන තිබෙනවා. ලංකා බැංකුවෙන් ඩොලර් මිලියන 80ක ණයක් ලබාගෙන තිබෙනවා. මහජන බැංකුවෙන් ඩොලර් මිලියන 466ක ණයක් අරගෙන තිබෙනවා. ඛනිජ තෙල්, එයාර් පෝර්ට් හා ගුවන් යානා හිඟ බදු මේ සියල්ලම සඳහා රුපියල් බිලියන 401ක ණයක් ගෙවන්න තිබෙනවා. මේ ගෙවීමට ණයක් ඇති එයාර් ලයින් එක කිසිවෙක් මිලදී ගන්නේ නැහැ. ආණ්ඩුව උත්සාහ ගන්නේ මෙම ණය භාණ්ඩාගාරය බාරගෙන ණය සීරෝ කර විකුණන්නයි.

## විකිණීම ව්‍යාපාරයක් වීම

එසේනම් මේ විකිණීම් කුමක් සඳහාද? එකක් ඔවුන් නියෝජනය කරන ආර්ථික උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහායි. අනික් හේතුව ඩොලර් හිඟකමයි. 1980 සිට රටට අවශ්‍ය ඩොලර් ඉපයීමට අප අසමත් වී තිබෙනවා. අපට ආනයනය හා ණය ගෙවීම සඳහා ඩොලර් මිලියන 14,800ක් අවශ්‍යයි. මීට පෙර අපි මේ හිඟය පියවූයේ ණයක් ගැනීමෙන් සහ විකුණා මුදල් ලබාගැනීමෙන්. 2020 වන විට ණය ලබාගැනීමට නොහැකි වීම නිසා ප්‍රශ්නයක් ලෙස අර්බුදය පැනනැගී ආවා. මේ මොහොතේ ඇති වී තිබෙන විදෙස් සංචිත හිඟය පියවා ගැනීම සඳහා විකිණීම සඳහා සූදානම් වෙනවා. තුන්වන හේතුව තමයි මොවුන්ගේ විකිණීමට ඇති කැමැත්ත. විකිණීම බිස්නස් එකක්. හිඟුරාන සීනි කම්හල විකුණන කොට අක්කර 7000ක උක් වගාවක් තිබුණා. අක්කර 300ක පැල තවානක් තිබුණා. කර්මාන්ත ශාලා තිබුණා. ගබඩාවේ සීනි තිබුණා. කම්හල සතුව මිලියන 70ක ස්ථාවර තැන්පතුවක් බැංකුවේ තිබුණා. ඒ මොහොතේ ගබඩාවේ තිබුණු සීනිවල වටිනාකමටත් වඩා අඩුවෙන් හිඟුරාන සීනි කම්හල විකුණුවා. මේ සෑම විකිණීමකටම ඔවුන්ට ලැබෙන කොමිස් මුදලත් හේතුවෙනවා. කුමන හේතු ඉදිරිපත් කළත් මේවා සම්පත් විකිණීමට සැඟවුණු හේතු ලෙස බලපා තිබෙනවා.

## සියල්ල ආණ්ඩුව සතුද?

එසේනම් දැන් අප කළ යුත්තේ මොකක්ද? දොඩම් ගොඩ බදාගත්තා වගේ සියල්ල ආණ්ඩුව බදාගත යුතුද? ආණ්ඩුව සමාජය පිළිබඳ වගකීම බාරගත යුතුයි. එක භාණ්ඩ හා සේවා සාධාරණ මිලකටත්, ගුණාත්මකභාවයෙනුත්, සුලභවත්, ලබාදීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවටයි. පෞද්ගලික සමාගමක් සමාජ වගකීම දරන්නේ නැහැ. ජනතාව වෙත ඇතිවන පීඩනයන් වෙළඳපොළේ සමහර ක්ෂේත්‍ර නියාමනය මගින් අපට පාලනය කළ හැකියි. පාරිභෝගික අධිකාරිය, මහජන උපයෝගිතා කොමිසම නියාමන ආයතනයන්. තවත් සමහර ක්ෂේත්‍රවලට සමුපකාර ජාල මගින් ක්‍රියාත්මක විය හැකියි. ඉන්දියාවේ ගුජරාට්වල තිබෙන 'අමුල්' කිරි කර්මාන්ත ශාලාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන්නේ සමුපකාර ක්‍රමය පදනම්ව. 'ඇන්කර්' හදන නිව්සීලන්තයේ 'ෆොන්ටේරා' කර්මාන්ත ශාලාව සමුපකාර ක්‍රමයක් මගින් ගොඩනැගුණු ආයතනයක්. සමුපකාර සංකල්පය වෙළඳපොළ හැසිරවීමේ ඉතා හොඳ පාලන ක්‍රමයක්. ලෝකයේ බොහෝ තැන්වල සමුපකාර ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. එය අප පිළිගත යුතුයි.

ප්‍රධාන සහල් සැපයුම්කරුවන් වෙළඳපොළ සඳහා අවශ්‍ය සහල්වලින් සපයන්නේ 23%යි. ලංකාවට දිනක පරිභෝජනය සඳහා අවශ්‍ය සහල් කිලෝ ග්‍රෑම් ලක්ෂ 65ක්. අරලිය සහල් දවසකට සපයන්නේ කිලෝ ලක්ෂ 04යි. 77%ක් තිබෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් අතේ. ප්‍රධාන සැපයුම්කරුවන් අඩු ප්‍රමාණයක් සැපයූවත්, ඔවුන්ට සහල් සහ වී වෙළඳපොළ හැසිරවීමට හැකියාව ලැබී තිබෙනවා. එයට හේතුව වී ඇත්තේ, නියමිත ප්‍රමාණයන් අඛණ්ඩව සැපයීමේ හැකියාව තිබීම, සන්නාමයක් තිබීම සහ ගුණාත්මකභාවයක් තිබීම නිසයි. ඒ නිසා සහල් සහ වී වෙළඳපොළේ අධිකාරීත්වයක් හිමිකර ගැනීමට හැකියාවක් ලැබී තිබෙනවා. අප කළ යුත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා ප්‍රාග්ධනය, තාක්ෂණය ලබාදී, සමිති ජාලයක් මගින් සංවිධානය කර, එක බ්‍රෑන්ඩ් එකකින්, එක කොලිටියකින්, අඛණ්ඩව වෙළඳපොළට සහල් එවීමට කටයුතු සලසා දීමයි. එවිට මේ අධිකාරිය බිඳින්න පුළුවන්.

තුන්වෙනුව නිදහස් වෙළඳපොළ ඇති කිරීමෙන් හා සිව්වනුව ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයෙන් මැදිහත් විය හැකියි. අපේ ජාතික ආර්ථික උපායමාර්ගයට අනුරූපීව ආණ්ඩුව හසුරුවනවා. රටේ ආර්ථික මර්මස්ථාන රජය සතු විය යුතුයි. රජය දේශපාලන මැදිහත්වීම කිරීම නතර කළ යුතුයි. අපි එය කරනවා. කරලත් තිබෙනවා. මම කෘෂිකර්ම ඇමති අවදියේ ලක් පොහොර සභාපති ලෙස පත් කළේ දක්ෂ, පළපුරුද්ද සහිත ව්‍යාපාරික දැනුමක් ඇති දේශපාලනයෙන් තොර කෙනෙක්. කොමර්ෂල් පොහොර එකේ, මිල්කෝ ආයතනයේ, කෘෂි රක්ෂණ මණ්ඩලයේ, ජල සම්පත් මණ්ඩලයේ, එන්.එල්.ඩී. ආයතනයේ සභාපතිවරුන් ලෙස පත්කළේ දේශපාලනයෙන් තොර දක්ෂ පුද්ගලයන්. මිල්කෝ ආයතනය ලාභ ලැබුවා පමණක් නොවෙයි, කිරි ලබාදුන් ගොවීන්ට පළමු වරට ලාභාංශ පවා ගෙව්වා. සේවක පඩි වැඩි කළා. මේ සෑම ආයතනයක්ම තිබුණාට වඩා කාර්යක්ෂමව පවත්වාගෙන ගියා.

මේ ආයතනවල දේශපාලන මැදිහත්වීම්වලින් ඉවත් කරන්න පියවර ගන්න ඕනෙ. ඊළඟට මේවායේ සිදුවන වංචා-දූෂණ ඉවත් කළ යුතුයි. විෂයයන් පිළිබඳ අවබෝධයක් සහිත තම දැනුම උපයෝගී කරගෙන අලුත් දෙයක් කළ හැකි අය සේවය සඳහා යොදවා ගන්නේ නම්, සේවකයා ඊට අනුරූපී ලෙස වැඩ කරනවා. එවිට වංචා - දූෂණ නවත්වන්න හැකියාව ලැබෙනවා. දැන් මේ ආයතන සේවකයන්ගෙන් පුරවලා. විදුලි බල මණ්ඩලයේ 25,624ක් සේවකයන්. පෙට්‍රෝලියම් එකේ 2300ක විතර සේවක සංඛ්‍යාවක්. IOC එකේ 166යි. එක් එක් ආයතන අමාත්‍යවරු තම ආයතනවලට හිතුමතේ දේශපාලන පත්වීම් ලබාදීමෙන් මේ සේවක සංඛ්‍යා වැඩිවී තිබෙනවා. විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව වැඩි වී ඇති අතර, අධ්‍යයන කාර්ය මණ්ඩලය අඩු වී තිබෙනවා. රාජ්‍ය සේවයේ පහළ සේවක සංඛ්‍යාව වැඩි කර තිබෙනවා. රාජ්‍ය සේවය කඩා වැටෙන්නේ එතනින්. ආසියාවේ ඉතාමත් හොඳ රාජ්‍ය සේවයක් අප සතුව තිබුණා. එය සම්පූර්ණයෙන්ම විනාශ කළේ දේශපාලන මැදිහත්වීමෙනුයි.

විදුලි බල මණ්ඩලය විකිණීමේ සාකච්ඡාවක් ඇති වී තිබෙනවා. මෙහි ප්‍රධාන ආයතන තුනක් තිබෙනවා. එකක් ජනනය. දෙක සම්ප්‍රේෂණය, තුන බෙදාහැරීම. ජනනය ආකාර තුනක් තිබෙනවා. ජල විදුලි බලාගාර, නොරොච්චෝලේ වැනි විදුලි බල මණ්ඩලය සතු බලාගාර තිබෙනවා. යුගදනවි බලාගාරය සතුව භාණ්ඩාගාරය සතු කොටස් තිබෙනවා. විදුලි බල මණ්ඩලයේත් එල්.ටී.එල්. එකෙත් කොටස් තිබෙනවා. මේ අතර පෞද්ගලික බලාගාරත් තිබෙනවා. ඔවුන්ගේ ජනන ඒකක වෙනුවෙන් ස්ථාවර ගාස්තුවක් අප ගෙවනවා. ඊට අමතරව පාවිච්චි කළොත් වැඩියෙන් ගෙවනවා.

මහවැලි ජල විදුලි බලාගාරවල ඒකකයක් නිපදවන්න රුපියල් 2.54ක් වියදම් වෙනවා. ලක්ෂපාන බලාගාරයේ ඒකකයක් හදන්න වියදම් වන්නේ 1.58යි. සමනල බලාගාරයෙන් විදුලි ඒකකයක් හදන්න යන්නේ 3.13යි. ජල විදුලි ඒකකයක් නිපදවන්න යන සාමාන්‍ය වියදම රු. 2.35යි. ජනනය කිරීම පාඩු ලබන්නේ නැහැ. මේ ජනනය කිරීම විකිණීමටත්, මෙම ආයතන පෞද්ගලීකරණය කරන්නත් උත්සාහ ගැනෙමින් තිබෙනවා. මන්නාරමේ මෙගාවොට් 100ක විදුලි බලාගාරයක් අප සතුව තිබෙනවා. අපේ කොස්ට් එක ඩොලර් ශත 3.5යි. ටෙන්ඩර් කැඳවීමකින් තොරව මෙගාවොට් 500ක බලාගාරයක් අදානිට දීමට සූදානම් වෙනවා. අවුරුද්දකට ඩොලර් මිලියන 151ක්. මේ ගිවිසුම ගහන්නේ අවුරුදු 30කට. ඩොලර් බිලියන 4ක් අවුරුදු 30 ඇතුළත ඔහු ගෙනියනවා.

## වෙනස් කළ යුතු මාවත

ආර්ථිකයටත්, ජනතාවටත් මේ විකිණීම බලපාන්නේ කෙසේද යන්න සොයා බැලීමටත් සේවක සංඛ්‍යාව කාර්යක්ෂම කරවීම සඳහාත්, සමහර ව්‍යාපෘති පමාවීම වැළැක්වීම සඳහාත් ජනතා ඉල්ලීම් අඩාලවීම වැළැක්වීම සඳහාත් අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගත කිරීමක් කළ යුතුයි. තෙල් සංස්ථාව තෙල් ගෙන්වනවා. පෞද්ගලික සමාගමක් ගබඩා කරනවා සහ බෙදා හැරීම කරනවා. මෙතන පාඩුව සිදුවන්නේ කොතනද? රජය තෙල් සහනාධාරයක් දීමට තීරණය කිරීමත් එහි බර තෙල් සංස්ථාවට පැටවීමෙන් තෙල් සංස්ථාව පාඩු ලබනවා. ජනතාවට සහනාධාර දිය යුතුයි. එහි බර භාණ්ඩාගාරය දැරිය යුතුයි. රජයේ ආයතන තෙල් සංස්ථාවට ගෙවිය යුතු ණය නොගෙවා තිබීමත් පාඩුවක්ව තිබෙනවා. උදාහරණයක් ලෙස එයාර් ලංකා සමාගම තෙල් සංස්ථාවට බිලියන 25.6ක්, විදුලි බල මණ්ඩලය බිලියන 47ක්, පුද්ගලික විදුලි බලාගාර බිලියන 6.7ක්, ත්‍රිවිධ හමුදාව මිලියන 820ක් තෙල් සංස්ථාවට ණයයි. තෙල් සංස්ථාවට එම මුදල් බැංකුවෙන් ලබාගැනීමට සිදුවීමත් ඒ සඳහා පොලිය ගෙවීමට සිදුවීමත් නිසාත් පාඩුව වැඩිවී තිබෙනවා. දැන් රුපියල් ට්‍රිලියනයක් ණය වෙලා තිබෙනවා. තෙල් සංස්ථාවේ පාඩුවට රුපියල කඩා වැටීමත් බලපා තිබෙනවා. මේ ආයතන නිසි කලමණාකරණයක් නොවීමත්, සේවක සංඛ්‍යාව වැඩිවීමත් දේශපාලන අත පෙවීමත් මේ පාඩුවට හේතුවී තිබෙනවා. පිරිපහදුව ආරම්භ කළේ 1969දීයි. නිසි කළමනාකරණයක් නොමැති වීමෙන් එය පාඩු ලබන තත්වයක් ඇතිවී තිබෙනවා.

ආර්ථිකයේ මර්මස්ථාන නියාමනය කර පවත්වාගෙන යා නොහැකියි. බලශක්ති ක්ෂේත්‍රය රජය සතුව තබාගත යුතුයි. මූල්‍ය වෙළඳපොළ තරගකාරිත්වයකින් පවත්වගෙන යා යුතුයි. මූල්‍ය වෙළඳපොළ රජය විසින් පාලනය කළ යුතුයි. බහුජාතික සමාගම් කිහිපයකට රටේ ආර්ථික තීරණ ගැනීමේ බලයත්, මූල්‍ය තීරණය ගැනීමේ බලයත්, දේශපාලන තීරණ ගැනීමේ බලයත් ආණ්ඩුව හැසිරවීමේ බලයත් ලබාදීමේ සැලසුමක් සකස් වෙමින් තිබෙනවා. අප එය පරාජය කළ යුතුයි. මූල්‍ය වෙළඳපොළ රජය පාලනය කළ යුතුයි. නියාමනය, තරගකාරිත්වය, වෙළඳපොළට මැදිහත්වීමෙන් රජයේ ආර්ථික පංගුව රජය ආරක්ෂා කරගත යුතුයි. වත්මන් ආර්ථික ප්‍රතිපත්ති තබාගෙන රටක් ගොඩනැංවිය නොහැකියි. පවතින ආර්ථික උපායමාර්ගත් මේ දේශපාලන ගමන්මඟත් තබාගෙන තවදුරටත් ඉදිරියට යා නොහැකියි. මේ ගමන් මඟ වෙනස් කළ යුතුයි.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




සංචාරක ආර්ථිකයක් උදෙසා...





නීතිවේදීන් බලමුළු ගන්වා...



NPP සභා ගොඩනගමින්...



ජීවන බරට එරෙහිව...



කැනඩා මහ කොමසාරිස් මුණගැසී...




අරගලයට නව ජවයක් වෙමින්...

# පරපුටු දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතුයි



ජාතික ජන බලවේගයේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

**ජනතාවගේ ප්‍රශ්නය ඇමතිවරුන් නොමැතිකම නොවන බවත් ජනතාව ආහාර හිඟය සහ මිල ඉහළ යාම පිළිබඳ ප්‍රශ්නයෙන්ද රට ඩොලර් නොමැතිවීමේ ප්‍රශ්නයෙන්ද පෙළෙමින් තිබියෙදී සියල්ල පසෙක තබා ආණ්ඩුව තමන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමට උත්සාහ කරමින් සිටින බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, ඔවුන් උපරිමයෙන් බෙදා ගන්නා අතරතුර ජනතාව අන්ත පීඩනයකට පත් කරන පරපුටු දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතුව ඇති බව අවධාරණය කළේය.**

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 09වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"අපේ රට ආර්ථික ප්‍රපාතයට හෙළුවේ මේ දේශපාලන සංස්කෘතියයි. මුදල් ඇමති රනිල් වික්‍රමසිංහ අතේ හැන්ද තියෙන්නේ. ඒ වගේම අටවා ගත් ජනාධිපති. අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු සිතූ සේ පත් කරමින් භාණ්ඩාගාරයේ ධනය බැකෝවලින් බෙදා ගනිමින් ජනතාවට කන් හැන්දෙන්වත් ලබා දෙන්නේ නැහැ. මෙවැනි විශාල ආර්ථික අර්බුදයක් තිබෙන අවස්ථාවක නාස්තිකාර ඇමති ධුර ඕනෑද? ජනතාවගේ ප්‍රශ්නය ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු, නැතිකමද? ඉන්ධන සමග පසු ගමන් ආරක්ෂක රථයක් ඇමතිවරයෙකට ලබා දෙනවා. රාජ්‍ය අමාත්‍ය ධුර වෙනුවෙන් ලබාදෙන අමාත්‍යාංශ කාර්යාලවලට කුලිය ගෙවන්න ඕනෑ. අමාත්‍යාංශ ලේකම් ඇතුළු ඉහළ නිලධාරීන්ට වාහන ඉන්ධන දුරකතන ඇතුළු වරප්‍රසාද ලබා දෙනවා. අතිරේක ලේකම්වරුන්ටත් ඒ වගෙයි. රාජ්‍ය අමාත්‍ය ධුරයක් නඩත්තු කරන්න යන වියදම අපේ රටේ ජනපදයක් නඩත්තු කරන්න යන වියදමක් වගෙයි. අපේ රටේ පුරවැසියන් මෙවැනි බරක් දරන්න ඕනෑද? අනෙක් පැත්තෙන් ජනතාවට 15%ක වැට් බදු, 2.5% බැගින් වැල් පොලී එකතු වන තව බදුත් පටවනවා. ජනතාවගේ ධනයෙන් පරපුටු රැලක් නඩත්තු වෙනවා. මහජනතාවට කන් හැන්දෙන්වත් නොදී ඇමතිවරුන්ට බැකෝවලින් බෙදා ගන්නවා. මේ වැනි වැය බරක් ජනතාව තවදුරටත් දැරිය යුතුද?

ජනතාවට තියෙන්නේ ආහාර හිඟයත් මිල ඉහළ යාමත් පිළිබඳ ප්‍රශ්න. රටට තියෙන්නේ ඩොලර් නැතිකමේ ප්‍රශ්නය. භාණ්ඩාගාරයට මුදල් නැතිකම. මේ හැම එකක්ම පැත්තක තියලා ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න විසඳා ගන්න අතර රනිල් වික්‍රමසිංහ වේදිකාවට ඇවිත් කියන්නේ රාජ්‍ය සේවය අඩු කරන්න, වියදම් අඩු කරන්න ඕනෑ කියලයි. ඒ අයට උපරිමයෙන් බෙදා ගන්න ගමන් ජනතාව අන්ත පීඩනයකට පත් කරනවා. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ. ඒ වෙනස් කිරීම සඳහා ජනතාව පෙළගැහෙන්න ඕනෑ. නාස්තිකාරී, විගඩම්කාරී සහ පිනට ලැබුණු වස්තුව වියදම් කරනවා වගේ යැපෙන දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතුයි. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා පෙළගැසෙන්න කියලා ජනතාවට අපි ආරාධනා කරනවා."

# රටේ පාලනය වෙනස් කිරීමේ අරගලයට සූදානම් වෙන්න



අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම්
**සමන්මලී ගුණසිංහ සහෝදරිය**

**ජනතාව මත බර පටවන ක්‍රියාමාර්ගවලට ආණ්ඩුව තවදුරටත් යොමු වන්නේනම් අරගල කිරීමේ පෙරමුණ ගැනීමට කාන්තාවන් සූදානම් බව ප්‍රකාශ කළ අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ සහෝදරිය, රටේ පාලනය වෙනස් කිරීමේ අරගලයට සූදානම් වන ලෙස කාන්තාවන්ගෙන් ඉල්ලා සිටින බවත් ජනතා හඬට කන් නොදෙන්නේනම් ආණ්ඩුව ගෙදර යැවීමේ අරගලයේ පෙරමුණ ගැනීමට කාන්තාවන් සූදානමින් සිටින බවත් අවධාරණය කළාය.**

සමන්මලී ගුණසිංහ සහෝදරිය මෙම අදහස් පළ කළේ පසුගිය 08වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. එහිදී තවදුරටත් අදහස් දැක්වූ සමන්මලී සහෝදරිය මෙසේද පැවසුවාය.

"මේ වනවිට ලෝක ආහාර සංවිධානය හෙළි කර තිබෙන්නේ සෑම පවුල් 05කින් 04කටම ආහාර මඟහැරෙන බවයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් ඒ චෝදනාවත් අම්මලාට එල්ල කර ආණ්ඩුව රැක ගන්න ක්‍රියාකරන බව අපිට පේනවා. ආහාර අර්බුදය ගැන කතා නොකර චෝදනා කරන අයට අපි ආරාධනා කරනවා අපේ කුස්සියට එන්න කියලා. එතකොට අධි උද්ධමන තත්වයත් මන්දපෝෂණ තත්වයත් දැසින්ම දැකගන්න පුළුවවන්. වැට් බද්ද 8%ක්ව තිබියෙදී රුපියල් 30ට තිබුණු පුංචි බිස්කට් පැකට් එකක් දැන් රු. 120ක් වී තිබෙනවා. පුංචි දරුවාට බිස්කට් පැකට් එකක් දෙන්න පුළුවන් වෙයිද? අත්‍යවශ්‍ය හැම භාණ්ඩයකටම කළු කෝට් ආණ්ඩුව පන්න පන්නා බදු ගහනවා. දවසින් දවස ආදායම් අහිමි වන ධීවර, වතුකරයේ ජනතාවට මේ ආර්ථිකය කිසිසේත්ම ඔරොත්තු දෙන්නේ නැහැ. බොහෝ දෙනෙක් එළිපිට කතා නොකළාට රු. 140ට තිබුණු සනීපාරක්ෂක තුවා පැකට් එකක් රු. 500 ඉක්මවලා. දියණියන් දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් ඉන්න පවුලක අම්මලාටත් දුවලටත් සනීපාරක්ෂක තුවා ගන්න අඩුම ගානේ රු. 2000ක අමතර වියදමක් යනවා. විශේෂයෙන්ම පාසැල් දරුවන්ගේ ක්‍රීඩා උත්සවවලට යන අවස්ථාවලකදී නිසි ආහාරයක් ලබාදෙන්න බැහැ. ඔවුන්ට සපත්තු කුට්ටමක් අරන් දෙන්න බැහැ. රු. 1500ට තිබුණු සපත්තු කුට්ටම අද රු. 6000 ඉක්මවලා. ක්‍රීඩා සපත්තු රු. 20,000 ඉක්මවලා. මේ අනුව ආණ්ඩුවේ හොරකම්වල බර දරුවෝ පිටත් පටවා තිබෙනවා. කුණු පොහොර නැව්වලට වන්දි දෙනවා. ප්‍රමාද නැව් ගාස්තු හැටියට ඩොලර් මිලියන ගණන් ගෙවනවා. අපේ දරුවන්ට ඇඳි වතත් නැති කරන තත්වයට කළු කෝට් ආණ්ඩුව කටයුතු කරනවා."

# ජනතාවට ආදරය කරන පාලනයක් නැතොත් අර්බුදවලට විසඳුම් නැහැ



ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

**රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අයවැයෙන් ආර්ථික අර්බුදයට විසඳුම් නොලැබෙනවා මෙන්ම එමගින් ආණ්ඩු පක්ෂයේ දේශපාලන ප්‍රතිපත්තියක් නොමැතිකමද තහවුරු වී ඇති බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ශක්තිමත්, ස්ථාවර, ජනතාවට ආදරය කරන පාලනයක් නිර්මාණය කර ගැනීමෙන් තොරව පවතින අර්බුදවලට විසඳුම් ලබාගත නොහැකි බව කියා සිටියේය.**

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 02වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද අයවැය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩල එකඟතා පිළිබඳ ස්ථාවරය පැහැදිලි කිරීම සඳහා පැවත්වූ මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

"තවමත් අපේ රටේ සමහර අයට මේ අර්බුදයේ බරපතළකම ගැන අවබෝධයක් නැහැ" කියලා හරි අපූරු කතාවක් රනිල් වික්‍රමසිංහ කියනවා. "දුෂ්කරතා ගැන අසීරුතා ගැන පෙන්වා දෙමින් ඔවුන් උපහාසයෙන් බලනවා. ඒ අය ගින්දර රත්වෙන තුරු හැළියේ කකුළුවෝ වගේ හිතන් ඉන්නවා." කියලත් කියනවා. මේ කියන කකුළුවෝ කවුද? රට ණය කරලා ආර්ථික අර්බුදය ඉදිරියේ දරුවන්ගේ අධ්‍යාපනය නැති කරලා, රැකියා නැති කරලා, මන්දපෝෂණයට ඇද දමලා, මේ රට විනාශයට පත් කළ කකුළුවෝ කවුද? දිය රත්වෙන තුරු හොරකම් කර කර, මහජන ධනය කොල්ලකමින් පිටරට ගිණුම්වල තැන්පත් කළ කකුළුවෝ මේ රටේ ජනතාව නොවෙයි. ඒ හොරු රැළම දැන් කියනවා දිය රත්වෙනකම් හැළියේ සතුටු වෙමින් ඉන්න කකුළුවෝ ගැන.

රිලවා නටවන කෙනා කෙහෙල් ගෙඩියක් දෙන්නේ රිලවා පිනුමක් පැන්නොත් විතරයි. ඒ වගේ මූල්‍ය අරමුදල විකිණිය යුතු ආයතන නම්කර ඩොලර් ටිකක් දෙන බව කියනවා. එකපාර දෙන්නෙත් නැහැ. රිලවාට කෙහෙල් ගෙඩිය පෙන්නනවා වගේ මාස 48ක් පුරා කොටස් වශයෙන් මේ මුදල දෙන බව කියනවා. බදු වැඩිකළ හොත් විතරයි, ජනතාවගේ සහන කැපුවොත් විතරයි, ආයතන විකුණුවොත් විතරයි ණය දෙන්නේ. ලංකාවේ ආර්ථිකය මූල්‍ය අරමුදලෙන් හසුරුවන්නේ මේ විදිහට. අවුරුදු හතරකට ලබාදෙන ණය වෙනුවෙන් ඔවුන්ට ගැලපෙන යෝජනා ක්‍රියාත්මක කරවා ගන්න කොන්දේසි දානවා."

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.